සැ. යු. -මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2006 වර්ෂයේ ජූලි-සැප්තැම්බර් කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,619 - 2009 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2009.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1124 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1352 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1355 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 සැප්තැම්බර් මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 සැප්තැම්බර් මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# රජයේ නිවේදන

## උග්ගල් අළුත් නුවර කතරගම දේවාලයේ ඇසළ පෙරහැර - 2009

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 2008 අගෝස්තු මස 29 දාතම අංක 1565 *ගැසට් පත්‍රයේ* පළ වූ උග්ගල් අළුත්නුවර කතරගම දේවාලයේ ඇසළ පෙරහැර උත්සව නියෝගය ද, 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත ද අනුව ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් මහීපාල මුදියන්සේලාගේ ගුණසිංහ වන මා වෙත පැවරී ඇති බලතල අනුව, 2009 උග්ගල් අළුත්නුවර කතරගම දේවාලයේ ඇසළ උත්සව කඳවුර පිළිබඳ පහත සඳහන් නියෝග පනවමි :

01. ඉඹුල්පේ උග්ගල් අළුත්නුවර කතරගම දේවාලයේ ඇසළ පෙරහැර උත්සවය 2009 සැප්තැම්බර් මස 21 වැනි දින ආරම්භ වී 2009 ඔක්තෝබර් මස 05 වැනි දින දිය කැපීමෙන් අවසන් වන බව දැනුම් දෙමි.

02. බස්නායක නිලමේතුමාගේ ප්‍රධානත්වයෙන්, දේවාල රාජකාරී මණ්ඩලයේ සහභාගිත්වයෙන් එළඹෙන සුභ මොහොතින් මහ පෙරහැර වීදි සංචාරය ආරම්භ කෙරේ.

03. දේවාලයේ දකුණට : පාර, චාලිස් මහතා යන අයගේ ඉඩම ද, බටහිරට : තිලකරත්න මහතාගේ ඉඩම හා වෙල් යාය ද, උතුරට: පී. ජී. ධර්මසේන, ඒ. එම්. සීතා රංජනී හා අබේරත්න මහතාගේ ඉඩම ද, නැගෙනහිරට : අජිත් ප්‍රියන්ත මහතා, මුණිදාස මහතා හා ඥාණදාස මහතාගේ ඉඩම ද මායිම්ව පිහිටි භූමි භාගය වන්දනාකරුවන්ට ලැගුම් සඳහා පෙරහැර නැරඹීමට වෙන් කරමි.

04. දේවාලයේ උඩ මළුව තුළ ආහාර පිසීම තහනම් කරමි.

05. දේවාලයේ උඩ මළුව තුළ සියලු වෙළඳාම් තහනම් කරමි.

06. පෙරහැර ගමන් ගන්නා වීදියේ උතුරු ප්‍රදේශයේ හා නැගෙනහිර දකුණු ප්‍රදේශය පෙරහැරට ගමන් කිරීමට අවහිර නොවන පරිදි වෙළඳාම් කිරීමට අවසර දෙමි.

07. ඉහත පහ සහ හය (05, 06) වගන්තිවලින් නියම කර ඇති පරිදි හැර කඳවුරු භූමිය ඇතුළත අන් කිසිදු ස්ථානයක වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

08. දේවාලයට පිවිසුම් මාර්ගයේ පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලු රථ වාහන මාගේ හෝ කඳවුරු භාර නිලධාරී තැනගේ බලපත්‍රයක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුල් කිරීම තහනම් කරමි.

09. බස්නායක නිලමේතුමා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

10. බද්දට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදි කරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තම තමන්ගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලු අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

11. මාගෙන් හා බස්නායක නිලමේතුමාගෙන් ලබා ගත් අවසර නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදි කිරීම තහනම් කරමි.

12. රතිඤ්ඤා, වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

13. ප්‍රාදේශීය ලේකම්ගේ, බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට් පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

එම්. එම්. ගුණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

2009 ජූලි මස 27 වැනි දින,
ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-248/2

---

## 2009 අම්මඩුව කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 2008 අගෝස්තු මස 22 දාතම අංක 1563/33 *ගැසට් පත්‍රයේ* පළ වූ වැලිගෙපොල අම්මඩුව කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර උත්සව නියෝගය ද, 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත ද අනුව වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම්, චිත්‍රා මානෙල් කෝට්ටවත්ත වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2009 අම්මඩුව කුඩා කතරගම ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පනවමි :

01. 2009 සැප්තැම්බර් මස 18 වැනි දින අම්මඩුව කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර උත්සවය 2009 ඔක්තෝබර් මස 08 වැනි දින දිය කැපීමෙන් අවසන් වන බව දැනුම් දෙමි.

02. දේවාලයේ සිට සිව් දිශාවට යාර හාරසියයක වපසරියකින් යුක්ත වේ. ගොඩකවෙල අම්මඩුව මාර්ගයේ කිලෝමීටර් 7 3/4 තැන පිහිටි කිවුලේ කුඹුර සිට පත්තිනි කපු නිලයට අයත් ඉඩමේ කෙළවරේ බෝක්කුව දක්වා භූමි භාගය මැදිව පිහිටි ප්‍රදේශය වන්දනාකරුවන්ට ලැගුම් සඳහා වූ කඳවුරු භූමිය වශයෙන් නම් කරමි.

03. දේවාල භූමිය උඩමළුව, පිට වීදිය, දෙවන මලුව හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.

04. දේවාල භූමියට මුහුණලා ඇති පහළ මළුවේ සිංහාසන මන්දිරය දෙපස වන්නට මා විසින් හෝ බස්නායක නිලමේ විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර මත වියළි ආහාර, පූජා භාණ්ඩ, විසිතුරු මෙවලම් විකිණීම සඳහා අවසර දෙමි. සිංහාසන මන්දිරයට පිටුපසින් දිවෙන මාර්ගයේ දකුණු පසට වන්නට ආහාර පාන විකිණීම සඳහා මාගේ අනුදැනුම මත බස්නායක නිලමේගේ අනුදැනුමට යටත්ව අවසර දෙමි. අප විසින් නියම කරන ලද උපදෙස් හා සීමාවන්ට යටත්ව මෙම අවසරය ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කරමි.

05. ඉහත 04 (හතර) වගන්තිවලින් නියම කර ඇති පූජා භූමිය තුළ හැර අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම තහනම් කරමි.

06. පෙරහැර ගමන් ගන්නා මාර්ගයේ පුද්ගලික වාහන ඇතුල් කිරීම හෝ නවතා තැබීම තහනම් කරමි. මාගේ හෝ බස්නායක

නිලමේගේ හෝ අවසරයක් නොමැතිව වාහන ඇතුල් කිරීම හෝ නතර කිරීම නොකළ යුතුය.

07. දේවාලයේ ඉහළ මළුවට වාහන ඇතුල් කිරීම හෝ නවතා තැබීම තහනම් කරමි. මාගේ හෝ බස්නායක නිලමේගේ හෝ අවසරයක් මත මිස වාහන ඇතුල් කිරීම නොකළ යුතු ය.

08. මා විසින් අදාළ භූමියේ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

09. බද්දට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදි කරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තම තමන්ගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලු අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් හා අධීක්ෂණය පරිදි ඉවත් කළ යුතු ය.

10. මාගෙන් ලබා ගත් අවසර නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම තහනම් කරමි.

11. කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම්ගෙන් අවසර ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නා වූ හෝ වෙන් කර තබන්නා වූ හෝ යම් බිමක් හෝ කඳවුරු ප්‍රදේශය තුළ ගං ඉවුරු මෙන් සෑදී තිබෙන්නා වූ යම් බිමක් ඇසුරු කරගෙන මඩුවක් හෝ යම් කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම නොකළ යුතු ය.

12. මාගේ අනුදැනුම ඇතිව, බස්නායක නිලමේගේ අවසරය ඇතිව මිස රතිඤ්ඤා, වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

13. මාගේ හෝ බස්නායක නිලමේගේ අවසරයකින් තොරව ටිකට් පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය. (අදාළ ප්‍රදේශය තුළ).

14. මාගෙන් ලබාගත් අවසරයක් නොමැතිව වන්දනාකරුවන් සඳහා කෑම බීම බෙදා දීම සඳහා අදාළ භූමියේ කිසිම ස්ථානයක් පාවිච්චි කිරීම තහනම් වේ.

සී. එම්. කෝට්ටවත්ත,
ප්‍රාදේශීය ලේකම්-වැලිගෙපොල.

2009 අගෝස්තු මස 03 වැනි දින,
වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-248/4

---

**බොල්තුඹේ ඇසළ පෙරහැර - 2009**

362 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ පළකර ඇති 2008 අගෝස්තු මස 29 දාතම අංක 1565 ගැසට් පත්‍රයේ පළ වූ ඉඹුල්පේ බොල්තුඹේ සමන් දේවාලයේ ඇසළ පෙරහැර උත්සව නියෝගය ද, 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව ද, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් මහීපාල මුදියන්සේලාගේ ගුණසිංහ වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2009 බොල්තුඹේ ඇසළ උත්සව කඳවුර පිළිබඳ පහත සඳහන් නියෝග පනවමි.

01. ඉඹුල්පේ බොල්තුඹේ සමන් දේවාලයේ ඇසළ පෙරහැර උත්සවය 2009 අගෝස්තු මස 20 වැනි දින ආරම්භ වී 2009 සැප්තැම්බර් මස 05 වැනි දින දිය කැපීමෙන් අවසන් වන බව දැනුම් දෙමි.

02. දේවාලයේ උතුරට : පාර, එම්. කේ. ලුවිස් සිංඤ්ඤෝ, එම්. කේ. පොඩි මහත්මයා යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : සිරි නිමල් හා එම්. කේ. විජේදාස යන අයගේ ඉඩම ද, දකුණට : රංබණ්ඩාර මහතාගේ ඉඩම ද, හා ගල්පඩිය වත්ත යන ඉඩම ද, බස්නාහිරට: බී. එම්. විජේහාමි හා නෝබට් චින්තාමනි යන අයගේ ඉඩම ද මායිම්ව පිහිටි භූමි භාගය වන්දනාකරුවන්ට ලැගුම් සඳහා වූ කඳවුරු භූමිය වශයෙන් නම් කරමි.

03. විහාර මළුව, බෝධි මළුව හා දේවාල භූමිය යන ස්ථානයන් හා ඒ අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.

04. උඩමළුව තුළ, දඩු හැල තුළ, චෛත්‍ය මළුව තුළ හා රටගෙහි මළුව තුළ, විහාර මළුව තුළ සියළු වෙළඳම් තහනම් කරමි.

05. පහළ වීදියේ දකුණු පැත්තට ප්‍රධාන ගල්පඩි පෙළ සිට සිංහාසන මන්දිරය දක්වා ද, ගල් පඩි පෙළ නැගෙනහිර පැත්තෙන් නැටුම් කාමරය දක්වා ද, පහළ වීදියේ දේවාලය දෙසට වන්නට රටගෙයි මළුව බැම්ම සිට චෛත්‍ය කොටස දක්වා ද මවිසින් නියම කරන ලද භූමිය ද, නැවත රටගෙහි මළුවට නැගෙනහිරින් හා දකුණින් පහළ කොටස ද, රටගෙහි ඉදිරි පසින් දේවාලයට නැගෙනහිර සීමාවට ආසන්නව වෙළඳාම් සඳහා පෙරහැර ගමන් කිරීමට අවහිර නොවන පරිදි වෙන් කරමි.

06. ඉහත 5 (පහ) වගන්තියෙන් නියම කර ඇති පරිදි හැර කඳවුරු භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

07. ප්‍රධාන මාර්ගයේ පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලු රථ වාහන මගෙන් හෝ කඳවුර භාර නිලධාරී තැනගේ බලපත්‍රයක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුල් කිරීම තහනම් කරමි.

08. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් බදු දෙන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

09. බද්දට ගන්නා ලද වෙළඳ බිම්වල ඉදි කරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් බදු ගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තම තමන්ගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලු අපද්‍රව්‍ය එකතු කර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

10. මාගෙන් ලබා ගත් අවසර නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ විශාල කිරීම තහනම් කරමි.

11. රතිඤ්ඤා වෙඩි ආදිය ප්‍රදේශය තුළ පත්තු කිරීම තහනම් ය.

12. ප්‍රාදේශීය ලේකම්ගේ, බලයලත් නිලධාරීන්ගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ

ටිකට් පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයන් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු ය.

එම්. එම්. ගුණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

2009 ජූලි මස 13 වැනි දින,
ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-248/3

---

**සබරගමු මහ සමන් දේවාලයීය ඇසළ උත්සවය - 2009**

362 අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ පළකර ඇති අංක 1563 - 2008 අගෝස්තු මස 15 දින ගැසට් පත්‍රය ප්‍රකාරව හා 1992 අංක 58 දරන බලතල පැවරීම් (ප්‍රාදේශීය ලේකම්වරුන්) පනත අනුව, රත්නපුර ප්‍රාදේශීය ලේකම් ජාහිත් මුහන්දිරමලාගේ දේවප්‍රිය විජයරාජ වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2009 සබරගමු මහ සමන් දේවාලයේ ඇසළ උත්සව කඳවුර සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග පනවමි.

01. මෙවර සබරගමු මහ සමන් දේවාලයීය ඇසළ උත්සවය 2009 වර්ෂයේ අගෝස්තු මස 21 දින ආරම්භ වී 2009 සැප්තැම්බර් මස 05 දින දිය කැපීමෙන් පසු අවසන් වන බව දැනුම් දෙමි.

02. උතුරට : වැසියන් පදිංචි පරවේණි නිලකරුවන්ගේ ඉඩම්, රථගාල හා සල්පිල භූමිය පෙන්වන සිමෙන්ති කණුව හා රථගාලට ඇතුල් වන පාර ද, දකුණට : තෙන්ගෙවත්ත හා කළු ගඟ ද, නැගෙනහිරට: රත්නපුර-පානදුර ප්‍රධාන මාර්ගය ද, බස්නාහිරට : දේවාලය සතු මහළුයන්වත්ත යන සීමාවන්ට මැදිව පිහිටි භූමි භාගය ඇසළ උත්සවය පවත්වන භූමි භාගය වේ. රත්නපුර-පානදුර ප්‍රධාන මාර්ගයේ ප්‍රධාන වාහල්කඩේ සිට කොටාඹේ දක්වා ගමන්කර, එතැන සිට මාර්ගය ඔස්සේ කළු ගඟ දක්වා හා කළු ගඟ ඔස්සේ රත්මල් ඇල්ල දක්වා ගමන්කර එම ස්ථානයේ දී දිය කපා ආපසු එම මාර්ගය ඔස්සේ නැවත මහ සමන් දේවාලය දක්වා පැමිණීම දිය කැපීමේ පෙරහැරේ ගමන් මාර්ගය වේ.

03. දේවාල භූමිය, වැලිමළුව, හුණුවල වීදිය හා කුරුවිට ගංපහේ වීදියට මැදිව පිහිටි භූමි භාගය හා වීදි අවට භූමිය තුළ ආහාර පිසීම තහනම් කරමි.

04. පෙරහැර දින පහ සඳහා සල්පිල් භූමියෙහි පිහිටි ස්ථිර මල්කඩ හය, තාවකාලික වෙළඳසැල් හා සල්පිල් භූමිය තාවකාලික වෙළඳසැල් 200ක් සඳහා මා විසින් වෙන්දේසිකර අවසරය ලබාදෙන බව දන්වමි. මෙම වෙළඳසැල්හි මල්, හඳුන්කූරු, ඉටිපන්දම්, කපුරු, පූජා වට්ටි, භාර ඔප්පු කිරීම සඳහා අවශ්‍ය රූප, රසකැවිලි හා විසිතුරු භාණ්ඩ විකිණීම සඳහා අවසරය දෙමි.

05. ඉහත 04 හි සඳහන් සල්පිල් භූමියෙහි හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිම ස්ථානයක වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන් තහනම් කරමි.

06. රථගාල පරිශ්‍රයෙහි හැර උත්සව භූමිය ඇතුළත අන් කිසිදු ස්ථානයක පුද්ගලික වාහන නතර කිරීම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියළුම රථවාහන මගෙන් හෝ කඳවුරු භාර නිලධාරී තැනගේ අවසර පත්‍රයක් නොමැතිව උත්සව භූමියට ඇතුල් කිරීම තහනම් කරමි.

07. රත්නපුර-පානදුර ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකර ඇති ප්‍රධාන වාහල්කඩ තුලින් දේවාල පූජා භූමියට වාහන ඇතුළු කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

08. මා විසින් කඳවුරු භූමිය තුළ වෙළඳාම් කිරීම සඳහා වෙන් කරනු ලබන බිම් කොටස් වෙන්දේසි කරන ආකාරය දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

09. වෙන්දේසි කරන ලද වෙළඳ බිම්වල ඉදිකරනු ලබන තාවකාලික ගොඩනැගිලි සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුකූල විය යුතුය. බිම් කොටස් ලබාගන්නා වෙළෙන්දන් විසින් ඇසළ උත්සවයෙන් පසු තමාගේ තාවකාලික ගොඩනැගිලි ඉවත් කර ගැනීමෙන් පසු කඳවුරු භූමිය තුළ පොලිතීන් ඇතුළු සියලුම අපද්‍රව්‍ය එකතුකර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ උපදෙස් පරිදි ඉවත් කළ යුතුය.

10. මගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිම ගොඩනැගිල්ලක් ඉදිකිරීම තහනම් කරමි.

15 වන ව්‍යවස්ථාව

(අ) කිසිවකු විසින් ප්‍රාදේශීය ලේකම් තැනගේ අවසරය ලබාගෙන මිස වීදියක් වශයෙන් පාවිච්චි කරන්නාවූ හෝ වෙන්කර තබන්නා වූ හෝ උත්සව භූමිය තුළ වෙනයම් භූමි කොටසක් හෝ ඇසුරු කරගෙන මඩුවක් හෝ යම්කිසි අන්දමක ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ විශාල කිරීම නොකළ යුතුය.

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ හෝ බලයලත් නිලධාරිගේ අනුමැතිය නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් උත්සව භූමිය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ දායක මුදල් එකතු කිරීම නොකළ යුතුය.

ජේ. එම්. දේවප්‍රිය විජයරාජ,
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

09-248/1

---

**වන්දනා ආඥාපනත**

2009 වර්ෂයේ පාණ්ඩිරුප්පු ශ්‍රී තුරෝපති අම්මන් කෝවිලේ වාර්ෂික උත්සවය

**අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ දෙමළ කොට්ඨාස ප්‍රාදේශීය ලේකම් කාර්යාල වසම**

මෙම දේවාලයේ 2009 වර්ෂයේ වාර්ෂික මහෝත්සවය 2009 සැප්තැම්බර් මස 15 දින ආරම්භව 2009 ඔක්තෝබර් මස 03 වැනි දින නිමාව දැක්වෙන

බව සියලුම වන්දනාකරුවන්ට හා අනෙකුත් පුද්ගලයන්ට මෙයින් දන්වනු ලැබේ.

02. 1951 මැයි මස 11 වැනි දින අංක 10247 දරන රජයේ ගැසට් පත්‍රයේ සඳහන් රෙගුලාසි මෙම උත්සව සමයේ පිළිපදින ලෙස සියලුම වන්දනාකරුවන්ට හා අනෙකුත් පුද්ගලයන්ට දැනුම් දෙනු ලැබේ.

03. මෙම උත්සවය භූමියේ මායිම් පහත සඳහන් පරිදි බව කරුණාවෙන් සලකන්න.

උතුරට : පාණ්ඩිරිප්පු පුල්ලෙයාර් කෝවිල පාර ;
නැගෙනහිරට : පාණ්ඩිරිප්පු වෙරළ පාර ;
දකුණට : කල්මුණෙ පාණ්ඩිරිප්පු මායිම් පාර ;
බස්නාහිරට : පෙරියකුලක්කට්ටු පාණ්ඩිරිප්පු.

එස්. ජගරාජන්,
ප්‍රාදේශීය ලේකම්.
කල්මුණේ (දෙ.කො.).

09-246

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 60620.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "අෂෙල් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.07.12 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "අෂෙල් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "අෂෙල් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-267

---

පීවී 67003.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "සිනෙල් මීඩියා මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2009.02.10 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සිනෙල් මීඩියා මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සිනෙල් මීඩියා මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-268

---

පීවී 64786.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "ටයිල් වර්ල්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.07.10 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ටයිල් වර්ල්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ටයිල් වර්ල්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-269

පීවී 60066.

## 2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ "සමන්තා ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.05.24 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සමන්තා ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්.

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සමන්තා ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-266

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මොණරාගල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.06.24 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.06.13 දින හා අංක 15074 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම විදාන ගමගේ උපුල් ප්‍රියදර්ශන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහතුන්ලක්ෂ හැටහයදහස් හාරසිය දහඅටයි ශත අසූදෙක (රු. 13,66,418.82) ක මුදලක් 2008.11.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 13,66,418.82ක මුදලට 2008.12.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිපුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 15074 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ, මුප්පන්නේගම ගමේ එගොඩවත්ත ඉඩමට බලයලත් මානක සී. පද්මනාදන් විසින් මැන සාදන ලද 1985.09.15 දිනැති අංක 140/35 දරන පිඹුරෙහි ලොට් අංක 5 දරන කොටස උතුරට : අංක 140/35 දරන පිඹුරේ ලොට් අංක 8ත් ද, නැගෙනහිරට : අංක 140/35 දරන පිඹුරේ ලොට් අංක 6ත් ද දකුණට : ප්‍රධාන පාරෙන් ද සහ බස්නාහිරට : ලොට් අංක 4ත් ද මායිම් වූ පර්චස් දහය (අ. 0, රූ. පර්. 10) ක් විශාල ඉඩම වේ. මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 46/78 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක බී, ජී. සී. පුෂ්පකුමාර විසින් 2007.03.02 වැනි දින අංක 3946 දරන පිඹුර නැවත මැනීමක අනුව පහත පරිදි දැක්වේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ, මුප්පන්නේගම ගමේ, එගොඩවත්ත දරන ඉඩම නැවත මැනීමකට අනුව අංක 3946 දරන පිඹුරේ ලොට් අංක 1 දරන කොටසට උතුරට : අංක 140/35 දරන පිඹුරේ ලොට් අංක 8ත් ද, නැගෙනහිරට : බලයලත් මානක සී. පද්මනාදන් විසින් 1985.09.15 දිනැති අංක 140/35 දරන පිඹුරේ ලොට් අංක 6 න් ද, දකුණට : පාර සඳහා වෙන් කරන ලද (එච්) සහ බස්නාහිරට : පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද, මායිම් වූ පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) හෝ හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි පහයි තුන (හෙක්. 0.0253)ක් විශාල ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/7

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - මොණරාගල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.06.24 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන

ලද්දාවූ ද 2006.10.05 දින හා අංක 14361 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම විදාන ගමගේ ප්‍රේමදාස සහ විදාන ගමගේ උපුල් ප්‍රියදර්ශන යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකසිය එක්ලක්ෂ හැත්තෑඑක්දහස් තුන්සිය හැත්තෑවයි ශත නමය (රු. 1,01,71,370.09) ක මුදලක් 2008.11.30 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,01,71,370.09ක මුදලට 2008.12.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 14361 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේ, මුප්පන්නේගම ගමේ එගොඩවත්ත නොහොත් කලුගහලන්ද දරන ඉඩමට බලයලත් මානක ටී. බී. අත්තනායක විසින් මැන සාදන ලද 2002.09.07 දිනැති අංක 1891 දරන පිඹුරෙහි ලොට් අංක 1 දරන කොටසට උතුරට : බුක්කිරිගොල්ල පන්සලට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : ලොට් අංක 2න් ද දකුණට : ලොට් අංක 2න් ද සහ බස්නාහිරට : ප්‍රධාන පාර සඳහා වෙන් කරන ලද කොටසින් ද මායිම් වූ පර්චස් දහඅටයි දශම දෙකයි හය (අ. 0, රූ. 0, පර්. 18.26) ක් විශාල ඉඩම ගොඩනැගිලි, ගහකොළ සහ සියලුදේත් සමග වේ. මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල් 53/186 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 1891 දරන පිඹුරේ වැඩිදුරටත් විස්තර පෙන්නුම් කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/6

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 1994.07.08 දින හා අංක 323 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හපුආරච්චිගේ සුසිරි වික්‍රමනායක පෙරේරා යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැටතුන් දහස් හත්සිය එකයි ශත හැටඅට (රු. 1,63,701.68) ක මුදලක් 2009.06.30 වන දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,63,701.68ක මුදලට 2008.07.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 323 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දලුවත්ත ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, (පානදුර ලියාපදිංචි සීමාව තුළ) කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, අදිකාරි පත්තුවේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාවේ, අදිකාරි පත්තු උප කාර්යාල සීමාවේ, කිදෙල්පිටිය ගමේ "මූණමල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක එස්. බෝපේ ආරච්චි විසින් මැන සාදන ලද 1985.06.10 දිනැති පිඹුරු අංක 120හි ලොට් අංක 2 ඉඩමට මායිම් වන උතුරට : දෙවටගහවත්තෙන් ද, නැගෙනහිරට : ලොට් 3න් ද, දකුණට : ලොට් 4න් සහ බස්නාහිරට : ලොට් 1න් මායිම් වූ පර්චස් එකොළහයි දශම අටයි හතරක් (අ. 0, රූ. 0, පර්. 11.84) විශාල මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 64/268 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 323 හා 1994.07.08 දිනැති උකස් ඔප්පුවේ දෙවන උපලේඛනයේ සඳහන් මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/5

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පිළියන්දල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කටුගස්තොට ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. රත්නායක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද 2005.06.25 වැනි දින හා අංක 3160 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුඩා විදානගේ වසන්ත පුෂ්පසිරි සහ ගොඩගේ ලක්මාලි චතුරිකා කුමාරි ගොඩගේ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ අසූහයදහස් හයසිය හතලිස් අටයි ශත අනූහතර (රු. 2,86,648.94) ක මුදලක් 2008.05.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,86,648.94ක මුදලට 2008.06.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3160 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුවේ, කළුගම්මන සියපත්තුවේ රණවන පිහිටි "ගමකුඹුරේ දරන්ඩ" (කොටසක් වන) (බලයලත් මිනින්දෝරු ජී. හීන්කෙන්ද මැන සාදන ලද 1989.09.07 දිනැති අංක 916ඒ හි දක්වා ඇති ලොට් අංක 1, 2, 3, 4, 5 සහ 2ඒ සහ මහනුවර දිසා අධිකරණයේ නඩු අංක ජී 3999හි ගොනුකර ඇති බලයලත් මිනින්දෝරු කේ. ජී. හේරත්ගේ 1957.09.18 දිනැති අංක 395 දරන පිඹුරේ ලොට් අංක 1බී සහ 2බී දරන ඉඩම් නැවත මැන ඒකාබද්ධ කළ ඉඩමෙන් කොටසක්) නමැති ඉඩමට බලයලත් මානක ඒ. ආර්. මරන්දවෙල විසින් මැන සාදන ලද අංක 2003-14 සහ 2002 දෙසැම්බර් මස 19 වැනි දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කර ඇති ලොට් 4 දරන ඉඩම් කොටස වන උතුරට : නිවෙස් සිට ප්‍රධාන පාර දක්වා යන අඩි පාරෙන් ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 1 සහ 2න් ද, දකුණට : එකී පිඹුරේ ලොට් 3න් ද (පාර) සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 5න් ද මායිම් වූ පර්චස් දහඅටයි දශම හතරයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 18.40) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි හයයි පහයි තුන (හෙක්. 0.04653) ක් විශාල ඉඩමට අයත් සියළුම දේත් සමග වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ එච්. 714/59, 60 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-456/4

---

## සම්පත් බැංකුව පී.එල්.සී.
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0002 5005 8659.

2008 දෙසැම්බර් මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොලොන්නාව, විජයපුර අංක 17 හි අබ්දුල් හමීඩ් සිත්ති මහරූෆා මොහමඩ් ෂියාන් මිහිලාර් හෙවත් මොහමඩ් මිහිලාර් ෂියාන් සහ අබ්දුල් ජබාර් මොහමඩ් මිහිලාර් යන අය බන්ධනදායී වශයෙන් හා ඉහත කී කොලොන්නාව, විජයපුර අංක 17 හි අබ්දුල් හමීඩ් සිත්ති මහරූෆා උකස්කරු වශයෙන් ද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. කේ. විජේතුංග විසින් හෝල්ඩින් සමාගම් අංක පී. කිව්. 144 සම්පත් බැංකුව පී. එල්. සී. නමට ලියා සහතික කළ 2006 ජූලි මස 17 දාතම හා අංක 2978 දරන උකස් බැඳුම්කරය මත මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ඔවුන් වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2008 ඔක්තෝබර් මස 08 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන්ලක්ෂ තිස්දහස් එකසිය තිස්හයයි ශත පනස් දෙකක් (රු.5,30,136.52 ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුව පී.එල්.සී. වෙත අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් පන්ලක්ෂ තිස්දහස් එකසිය තිස්හයයි ශත පනස් දෙකක් (රු. 5,30,136.52 ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් හාරලක්ෂ හැත්තෑපන් දහසක (රු.4,75,000 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට පහක් (5%) සාමාන්‍ය පරිමාණයේ ප්‍රධාන ණය දීමේ අනුපාතය ලෙස සියයට දහහතක් (17%) බැගින් 2008 ඔක්තෝබර් මස 09 වැනි දින සිට විකුණුම් දින තෙක් තවදුරටත් පොළී මුදල් ද සමග එකී අංක 2978 උකස් බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල පියවා නිමවන දිනතෙක් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් එකී 2978 දරන බැඳුම්කරය මත සම්පත් බැංකුව පී. එල්. සී. වෙත උකස් තබන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සම්පත් බැංකුවේ පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ ප්‍රාදේශීය උපදිසාපති කොට්ඨාසයේ රාගම් (අඹතලෙන් පහළ) පත්තුවේ අංක 14, කැප්පෙටිපොල පාරේ ලොට් 10 ලෙස 1977 මැයි මස 31 දාතම හා අංක 308 දරන පිඹුරේ දැක්වෙන උතුරට : ලොට් 9 ද, නැගෙනහිරට : මහ නගර සභා පාර ද, දකුණට : විජය පාර අංක 20 දරන දෙල්ගහවත්ත ද, බටහිරට : කැප්පෙටිපොල පාර අංක 37 දරන ගොරකගහවත්ත ද මායිම් වූ පර්චස් හයයි දශම දෙකයි අටක් (අ. 0, රූ. 0, පර්. 6.28) විශාලැති පිඹුරු අංක 308 සඳහන් ලොට් අංක 10 ලෙස දැක්වෙන කොළඹ ඉඩම් කාර්යාලයේ බී 869/69 වෙළුමේ හා පත්ඉරුවේ ලියාපදිංචි කළ ඉඩම හා පරිශ්‍රය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-439

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - වත්තල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔලුව විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.11.29 වැනි දින හා අංක 2233 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උරල ලියනගේ දොන් ජයන්ත ගුණසිංහ යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහහත්ලක්ෂ හැත්තෑහතරදහස් තුන්සිය තිස්දෙකයි ශත තුන (රු. 17,74,332.03) ක මුදලක් 2009.01.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 17,74,332.03ක මුදලට 2009.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2233 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහත්මිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ මහර සූරියපාලුව උප කාර්යාල අංක 1 හි මහර සූරියපාලුව "ගොරකගහවත්ත" දරන ඉඩමට බලයලත් මානක එස්. පී. එන්. සදගිරි විසින් මැන සාදන ලද 2006.01.31 සහ 2006.02.04 දිනැති සහ අංක 1346 දරන පිඹුරෙහි ලොට් අංක 4 දරන කොටසට වන උතුරට : දෙවන පාරෙන් සහ පී. කේ. රූපසිංහට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : වයි. ඩී. කරුණාරත්නට අයිති ඉඩමෙන් ද, දකුණට : දෙවට පාරෙන් සහ එච්. ඒ. ජෝතිපාලට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : ලොට් අංක 3 සහ 5 න් මායිම් වූ එකී අංක 1346 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දොළහයි දශම පහයි බින්දුව (අ. 0. රූ. 0, පර්. 12.50) ක් විශාල ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 765/142 යටතේ ලියාපදිංචි වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/2

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - වත්තලම ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔලුව විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.02.27 වැනි දින හා අංක 1577 දරන බැඳුම්කරය යටතේ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනත් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2007.11.29 වැනි දින හා අංක 3044 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල ගෙවීම, උරල ලියනගේ දොන් ජයන්ත ගුණසිංහ සහ හෙට්ටිආරච්චිගේ ශාන්ති ගුණසේකර (විවාහයට පෙර ගුණසිංහ) යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තිස්හත්ලක්ෂ හැටහයදහස් අටසිය හතළිහයි ශත හැත්තෑඑක (රු. 37,66,840.71) ක මුදලක් 2009.01.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 37,66,840.71ක මුදලට 2009.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1577 සහ 3044 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහත්මිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගොන්ගිතොට සහ එඬේරමුල්ල, දෙල්ගහවත්ත, කෙටකෙලගහවත්ත, මිල්ලගහවත්ත, දෙවටගහවත්ත, ගොරකගහවත්ත සහ පරනකන්ද නමැති ඉඩමට සර්වේ ජනරාල් විසින් මැන සාදන ලද 1965.10.19 දින සහ අංක ඒ5018 දරන පිඹුරෙහි ලොට් අංක 242 දරන කොටස වන උතුරට : මෙම ඉඩමේම ලොට් අංක 235න් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : මෙම ඉඩමේම ලොට් අංක 243න් ද සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් අංක 241න් ද මායිම් වූ පර්චස් එකොළහයි දශම එක (අ. 0, රූ. 0, පර්. 11.1) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියළුදේත් සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 763/185 යටතේ ලියාපදිංචි වී ඇත.

ලොට් අංක 242 දරන ඉහත ඉඩම නැවත මැනීමකට අනුව පහත පරිදි වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගාන්ගිතොට සහ එඬේරමුල්ල, දෙල්ගහවත්ත, කෙටකෙලගහවත්ත, මිල්ලගහවත්ත, දෙවටගහවත්ත, ගොරකගහවත්ත සහ පරනකන්ද නමැති ඉඩමට බලයලත් මානක ඩී. සී. එම්. එස්. විමලරත්න විසින් මැන සාදන ලද 2006.01.10 වැනි දින සහ අංක

13/2006 දරන පිඹුරෙහි ලොට් අංක 242ඒ දරන කොටස වන උතුරට : පිඹුරු අංක 5018ඒ හි ලොට් අංක 235න් ද, නැගෙනහිරට : පාරෙන් ද, දකුණට : පිඹුරු අංක ඒ5018හි ලොට් අංක 243න් ද සහ බස්නාහිරට : පිඹුරු අංක ඒ5018හි ලොට් අංක 241 මායිම් වූ පර්චස් එකොළහයි දශම එකයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 11.10) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියළුදේත් සමග වේ.

බලයලත් මානක විසින් 1965.10.19 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක ඒ5018හි වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පිටකොටුව ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. සී. පී. වෙත්තසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2004.05.11 දින හා අංක 2182 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල ගෙවීම, මේරි රංජලා පෙරේරා සහ ලූල්බැද්දේ වඩුගේ ජැස්මින් මැටිල්ඩා පෙරේරා විවාහයට පෙර මනෝරත්න යන අයවළුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්ලක්ෂ හත්දහස් තුන්සිය හැත්තෑඅටයි ශත අනූහය (රු. 3,07,378.96) ක මුදලක් 2009.03.12 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 3,07,378.96ක මුදලට 2009.03.13 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 2182 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අඹතලෙන්පහළ මුල්ලේරියාව කොටිකාවත්ත ප්‍රාදේශීය සභා සීමාව තුළ කොටිකාවත්තේ පිහිටි කොන්ගහවත්ත, දෙණිපිටියවත්ත, මුත්තැන් ඕවිට, දෙණිපිට කුඹුර, නාගහකුඹුර සහ ගලබොඩකුඹුර දරන ඉඩමට බලයලත් මානක ඒ. ඊ. සී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1992.02.18 දින සහ අංක 1950 දරන පිඹුරෙහි ලොට් අංක 2එම් දරන කොටස වන උතුරට : ලොට් අංක 2අයි සහ 2ඕ ද, නැගෙනහිරට : ලොට් අංක 2ඕ සහ 2එන් ද, දකුණට : ලොට් අංක 2කේ සහ 2එල් ද සහ බස්නාහිරට : ලොට් අංක 2එල් සහ 2අයි වලින් ද මායිම් වූ එකී අංක 1950 දරන පිඹුර ප්‍රකාරව පර්චස් එකොළහ (අ. 0, රූ. 0, පර්. 11)ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි, සහ එහි පිහිටි පිහිටි සියළුදේත් සමග වේ. මෙය කොළඹ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 736/162 යටතේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මානක ඒ. ඊ. සී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 1992.02.18 වැනි දින අංක 1950 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 21 දරන කොටස මතින් පොදු මාර්ග අයිතිය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-456/12

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මාරවිල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. එම්. ඩී. ජයසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.11.01 වැනි දින හා අංක 15894 සහ 2007.05.17 වැනි දින අංක 16469 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලංකා හළුගේ ලක්ෂ්මන් ජෙරාඩ් ප්‍රියශාන්ත ප්‍රනාන්දු ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ රුපියල් විසිහයලක්ෂ තිස්හයදහස් අටසිය විසිඑකයි ශත අනූව (රු. 26,36,821.90) ක මුදලක් 2009.06.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 26,36,821.90ක මුදලට 2009.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 15894 සහ 16469 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරළේ, යටකලං පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය සීමාව තුළ දකුණු තෝඩුවාව ගමෙහි පිහිටි "ලුණුවරනාගහගල සහ පළුගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් 1980 සැප්තැම්බර් මස 17 වැනි දින අංක 492/80 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් 6" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : වී. සී. පාරෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 492/80ට අයත් ලොට් අංක 7න් ද, දකුණට : පිඹුරු අංක 492/80ට අයත් ලොට් අංක 8න් ද සහ බස්නාහිරට : අඩි 12ක් පළලැති පාරක් ලෙස ලකුණු කරන ලද ලොට් ආර් 1න් ද මායිම් වූ ඉඩම ප්‍රකාරව පර්චස් දහතුනයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 13.20) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි තුනයි තුනක (හෙක්. 0.0333) විශාල ඉඩම නැවත මැනීමකින් පසුව බලයලත් මානක ආර්. බී. නවරත්න විසින් 2006 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 5321 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස වන උතුරට : ප්‍රාදේශීය සභා පාරෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 492/80ට අයත් ලොට් අංක 7න් ද, දකුණට : පිඹුරු අංක 492/80ට අයත් ලොට් අංක 9න් ද සහ බස්නාහිරට : පාරක් ලෙස වෙන් කර ලකුණු කරන ලද ලොට් ආර් 1න් ද, මායිම් වූ ඉඩම ප්‍රකාරව පර්චස් දහතුනයි දශම දෙකයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 13.20) හෝ හෙක්ටයාර් බිංදුවයි තුනයි තුනයි තුනක (හෙක්. 0.0333) විශාල ඉඩම තුළ පිහිටි පස්, ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග සමග මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 103/148 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-456/11

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - වත්තල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හල්ඔළුව විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.08.02 වැනි දින හා අංක 1710 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උරල ලියනගේ දොන් ජයන්ත ගුණසිංහ තනි අයිතිකරු ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඇස්ට්‍රොලොජි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දසලක්ෂ දහනමදහස් හාරසිය විසිනමයයි ශත දහයක (රු. 10,19,429.10) මුදලක් 2009.02.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 10,19,429.10ක මුදලට 2009.02.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1710 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහත්මිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ හෙනරත්ගොඩ කොට්ඨාසයේ, ගල්ඔලුව, නැදුගමුව පාරේ, 1 වැනි පටුමගේ, අංක 48 මාළිගාවත්ත දරන ඉඩමට බලයලත් මානක ආර්. එල්. ද සිල්වා විසින් මැන සාදන ලද 1994.12.01 දිනැති සහ අංක 220 දරන පිඹුරෙහි ලොට් අංක 2 දරන කොටසට වන උතුරට : පිඹුරු අංක 220හි ලොට් අංක 8 (අඩි 10 පළල පාර සඳහා වෙන් කරන ලද කොටස) න් ද, නැගෙනහිරට : ජුබිලි මාවතෙන් ද, දකුණට : ලොට් අංක 3න් ද සහ බටහිරට : ලොට් අංක 1න් මායිම් වූ එකී අංක 220 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිඑකයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 21.5)ක් විශාල ඉඩම වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 431/198 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-456/1

---

### හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - තංගල්ල ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2006.01.24, සහ 2008.11.05 දින හා පිළිවෙලින් අංක 8142 සහ 10235 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොරෙන්සු හේවගේ මිලාන් සහ වර්ණකුලසූරිය පටබැඳිගේ ලසික චන්ද්‍රානි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහතුන්ලක්ෂ පනස්හත්දහස් හත්සිය හැටහතයි ශත හතලිස්නමය (රු. 13,57,767.49) ක මුදලක් 2009.04.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 13,57,767.49ක මුදලට 2009.05.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 8142 සහ 10235 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ, ගිරුවා පත්තුවේ, ලුනම-දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉඩමට බලයලත් මානක එල්. කේ. ගුණසේකර විසින් මැන සාදන ලද 2004.09.08 වැනි දින අංක 4566 දරන පිඹුරෙහි ලොට් අංක 2 දරන කොටස වන උතුරට : පිඹුරු අංක 4566හි ලොට් අංක 1න් ද, නැගෙනහිරට : එල්. එම්. මෙන්ඩිස්ට අයිති ඉඩමෙන් ද, දකුණට : නිමල් අබේසේකරට අයිති ඉඩමෙන් ද සහ බටහිරට : පාරෙන් ද මායිම් වූ රූඩ් දෙක (අ. 0, රූ. 2, පර්. 0) හෝ හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි බිංදුවයි තුනක් (හෙක්ට 0.203) විශාල ඉඩම වේ. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හම්/122/1300/97ඒ යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

09-456/8

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංකය : 1003 5018 6403.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008 ක් වූ අගෝස්තු මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කොට ඇති සම්පත් බැංකුව පීඑල්සී යනුවෙන් දැන් හඳුන්වන සීමාසහිත සම්පත් බැංකුව (සමාගම් අංක පීකිව් 144 යටතේ ලියාපදිංචි කොට ඇත.) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් ලියා සහතික කරන ලද 2005 නොවැම්බර් මස 8 දාතම හා අංක 1161 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ මඩපාත, මාකන්දන, අරලිය උයන, අංක 65/21 බී හි පදිංචි හඳුවල දේවගේ උපුල් ඉන්දිකා නොහොත් ඉන්දිකා හඳුවල යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන් ලක්ෂ තිස්පන්දහස් පන්සිය දොළහයි ශත අසූතුනක (රු.535,512.83) ක මුදලක් 2008 ජූනි 17 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පන් ලක්ෂ තිස්පන්දහස් පන්සිය දොළහයි ශත අසූ තුනක (රු.535,512.83) ක මුදල ද 2008 ජූනි 18 වැනිදා සිට අංක 1161 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර ලක්ෂ අනූ හය දහස් නමසිය අසූනමයයි ශත හතලිස් අටක (රු.496,989.48) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොළිය ද දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1161 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, උඩුගහ පත්තු සල්පිටි කෝරළේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අම්බලන්ගොඩ ග්‍රාමයේ පිහිටි "අලුබෝගහවත්ත නොහොත් අල්බෝගහ කනත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. හෙට්ටිගේ යන අය විසින් සාදන ලද 1997 අගෝස්තු 12 දාතම හා අංක 2268 පිඹුරේ ලොට් 2 වශයෙන් නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 3 නැගෙනහිරට : ලොට් 1 දකුණට : පාර (අඩි 20 පළල) සහ බස්නාහිරට : අංක 2268 පිඹුරේ ලොට් 9 (අඩි 10 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A0, R0, P10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් වෙළුම/පිටුව එන් 370/48 හි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2268 දරන පිඹුරේ නිරූපිත ලොට් 9 (අඩි 10 පළල පාර) සහ අංක 2029 දරන පිඹුරේ ලොට් 12 (අඩි 20 පළල පාර) යන ඒවා දිගේ හා ඒවා මතින් මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-432/14

### සම්පත් බැංකුව පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ගිණුම් අංකය : 1016 5010 5355.

2008 මාර්තු මස 27 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමකදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වේයන්ගොඩ, මාරපොල අංක 160/ඒ හි අමරසිංහ කලුආරච්චිගේ නයන ජයන්ත යන අය බන්ධනදායී වශයෙන් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. රණවීර විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කල 2002 ජනවාරි 18 දාතම හා අංක 4235 සහ 2004 ජනවාරි 12 දාතම හා අංක 4402 දරන උකස් බැඳුම්කරය මගින් උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2008 ජනවාරි මස 04 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය ලක්ෂ දාහත් දහස් හයසිය හතලිස් එකකුත් ශත පනස් හතක් (රු.6,17,641.57 ක් පමණයි) එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් හය ලක්ෂ දාහත් දහස් හයසිය හතලිස් එකකුත් ශත පනස් හතක් (රු.6,17,641.57 ක් පමණයි) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් පන්ලක්ෂ අනූහතර දහස් හයසිය විසි එකකුත් ශත දාහතක (රු.5,94,621.17 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහතර (14%) බැගින් 2008 ජනවාරි මස 05 වැනි දින සිට එකී අංක 4235 සහ 4402 දරන බැඳුම්කරය මත අයවිය යුතුව හිගව ඇති සම්පූර්ණ ණය මුදල ගෙවා/පියවා නිමාකරන දින තෙක් තවදුරටත් පොළිය ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 4235 සහ 4402 දරන බැඳුම්කර මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය, මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරලේ මැද පත්තුවේ මහලෙගොඩ පිහිටි කදුගහලන්ද කැරකහලන්ද නොහොත් වීරකෝන්වත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් මැන සාදන ලද 1982 පෙබරවාරි මස 18 දාතම හා අංක 2103 පිඹුරේ ලොට් 88 ලෙස ලකුණු කොට දක්වා ඇති ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඊ 668/237 යටතේ ලියාපදංචි කළ උතුරට : ලොට් 6 ද, නැගෙනහිරට : ලොට් 89 ද, දකුණට : ලොට් 117 ද සහ බටහිරට : ලොට් ආර් 13 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0, රූඩ්. 0, පර්. 20) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්වද සමග තව ද පහත විස්තර කෙරෙන පාරට වෙන්කල කොටස මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

ගම්පහ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඊ 292/69 යටතේ ලියාපදිංචි කල ඉහත කී අංක 2103 දරන පිඹුරේ ලොට් ආර් 6 ලෙස දැක්වෙන උතුරටඃ ලොට් 84, 82, 82, 79, ආර් 5, 78, 77. 76, 75, 74, 73, 72, 70, 69, සහ 66 ද නැගෙනහිරට : ලොට් ආර් 9 ද, දකුණට : ලොට් 85 සිට 96 දක්වා, 98 සිට 101 දක්වා ආර් 8, ආර්. 7, සහ ආර් 13 ද සහ බටහිරට : පී. ඩබ්ලිව්. ඩී. පාර ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිහයයි දශම පහයි බිංදුවක් (අක්. 0, රූ. 1, පර්. 26.50) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-432/12

---

### සම්පත් බැංකුව - පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංක : 0040 1000 2368.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ ජූලි මස 28 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. ආර්. සේනානායක යන අය විසින් ලියා සහතික කරන ලද 2005 නොවැම්බර් 09 දාතම හා අංක 657 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ජිනේෂා ගාමන්ට්ස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස්නමලක්ෂ එක්දහස් හත්සිය දහනමයයි ශත අසූතුනක (රු.3.901,719.83) මුදලක් 2009 ජූනි මස 22 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස්නමලක්ෂ එක්දහස් හත්සිය දහනමයයි ශත අසූතුනක (රු.3,901,719.83) මුදල ද 2009 ජූනි මස 23 වැනි දින සිට අංක 657 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස්හතර ලක්ෂ පනස් අටදහස් දෙසිය දහයක (රු.3,458,210) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙන් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 657 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවත් තුළ, හෝමාගම පිහිටි වලව්ව පාර වරිපනම් අංක 20, දරන "අළුබෝගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් සාදන ලද 1999 දෙසැම්බර් 07 දාතම හා අංක 1540 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 සී1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පිඹුරු අංක 44678 හි ලොට් 4 නැගෙනහිරට : පිඹුරු අංක. 4468 හි ලොට් 2 සහ පිඹුරු අංක 1081හි ලොට් 1, දකුණට : පිඹුරු අංක 1081හි ලොට් 1 සහ පාර සහ බස්නාහිරට : පිඹුරු අංක 536 හි ලොට් 1 ඒ සහ 1බී යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිහතයි දශම හයයි පහක් (අ. 0, රූ. 0, පර්. 27.65) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1540 ට අනුව වෙළුම/පත්ඉරුව ජී1464/178 හි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-432/9

---

### සීමාසහිත සම්පත් බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0023 5001 8134.

2005 සැප්තැම්බර් 01 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමක දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කුලියාපිටිය, පරාක්‍රම පාරේ, අංක 65 හි පදිංචි හේරත් හිටිහාමිල්ලාගේ ප්‍රේමසිරි හේරත් නොහොත් හේරත් හිටිහාමිල්ලාගේ ප්‍රේමසිරි හේරත් යන අය බන්ධනදායීන් වශයෙන්, කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් එච්. එස්. පී. පෙරේරා විසින් සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2001 ජූලි 24 දාතම හා අංක 5442 දරන උකස් බැඳුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන්, 2004 මැයි 31 වැනි දිනට, ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන් ලක්ෂ පන්දහස් පන්සිය අසූ අටයි ශත දාසයක (රු. 3,05,588.16) මුදල් ප්‍රමාණයක් එකී බැඳුම්කරය මත සීමාසහිත සම්පත් බැංකුවට අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තුන්ලක්ෂ පන්දහස් පන්සිය අසූ අටයි ශත දාසයක (රු. 3,05,588.16) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දෙලක්ෂ විසිදහස් නවයයි අසූ හතරයි ශත හතක (රු. 2,20,984.07) මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් 2004 ජුනි 01 වන දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවාද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 5442 දරන බැඳුම්කර මගින් සීමාසහිත සම්පත් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට, සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරුන බලය පරිදි මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, කටුගම්පොල හත්පත්තුවේ, දකුණු කටුගම්පොල කෝරළේ, එගොඩමුල්ලේ පිහිටි ගොරකගහ ගොඩ මඩ ඉඩම නමින් හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 1998 අගෝස්තු 10 දාතම හා අංක 1434 දරන පිඹුරේ නිරූපිත ලොට් 1A වශයෙන් ලකුණු කොට දක්වා ඇති, කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව K159/273 හි ලියාපදිංචි කොට ඇති එකී අංක 1434 පිඹුරට අනුව, උතුරට : කේ. ඩී. එෆ්. ජයසේකර ගේ ඉඩම ද, නැගෙනහිරට : කුලියාපිටිය නාත්තන්ඩිය ප්‍රධාන මාර්ගයේ සිට පලුගමුව දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර ද සහ ඉහත කී අංක 1434 පිඹුරේ ලොට් 2A ද, දකුණට : ඉහත කී අංක 1434 පිඹුරේ ලොට් 2A ද සහ බටහිරට : ලොට් 1B වෙන් කරන ඇල මාර්ගය ද, මායිම්වන ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් විස්සයි දශම නවයක් (අක්. 2, රූඩ්. 3, පර්. 20.9) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම. එහි පිහිටි හා එයට අදාල පස, ගහකොල, වගාවන් ගොඩනැගිලි හා අනෙකුත් සියළු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-432/11

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.12 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඩබ්. එච්. එම්. බන්දුල, එච්. විජේසිංහ විසින් සහතික කරන ලද 2003.06.06 දිනැති අංක 1604 දරන උකස් බැඳුම්කරය, 2004.05.17 දිනැති අංක 2020 දරන බැඳුම්කරය සහ 2006.10.17 දිනැති අංක 3610 දරන බැඳුම්කරය යන සියල්ල මත මුල් මුදල හා 2009.04.23 දින තෙක් පොලිය වශයෙන් ණය ගිණුම මත රුපියල් හාරලක්ෂ අසූපන්දහස් තුන්සිය පනස් හයයි ශත අනූඑකක් (රු.4,85,356.91) සහ අයිරා ගිණුම මත රුපියල් දෙලක්ෂ හාරසීය පනස් හතයි ශත තිස්පහක (රු.2,00,457.35) මුදලක් සමග ණය ගිණුම මත රුපියල් තුන්ලක්ෂ පනස් දෙදහස් පන්සියයක (රු. 3,52,500) මුදලක් සහ අයිරා ගිණුම මත රුපියල් එක්ලක්ෂ පනස් දහසක් (රු.1,50,000) මත පිළිවෙලින් වසරකට සියයට විසිඅටයි දශම පහ (28.5%) සහ සියයට විසිපහයි දශම පහයි බිංදුව (25.50%) බැගින් පොලියක් ද, 2009.04.24 දින සිට ගෙවීම නිම කරන දින තෙක් කුලියාපිටිය, පහල දියදොර, රත්මලේවත්ත, අංක 64 හි පදිංචි ගුරුසිංහ සුදුහකුරු දේවයලාගේ සරත් චන්ද්‍රසිරි නොහොත් ගරුසිංහ සුදුහකුරු දේවගේ සරත් චන්ද්‍රසිරි මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1604, 2020, 3610 දරන බැඳුම්කරය මත අයවියයුතු ඉහත '1' හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී

ආකාරයට අයවිය යුතුව පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්නල පාරේ, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියුස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, මයුරාවතී කෝරළේ, රත්මලේ පිහිටි රත්මලේවත්ත ලෙස ප්‍රසිද්ධ සහ එනැමැති ඉඩමෙහි එෆ්. වී. පී. 927 දරන පිඹුරෙහි ලොට් 64 ලෙස දක්වා නිරූපනය කර ඇති ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 64, එකී අංක 927 දරන පිඹුර ප්‍රකාර උතුරට : පාරකට වෙන්කළ කොටසක් වන ලොට් 43 ද, නැගෙනහිරට : පාවුලුට අයත් ලොට් 63 ද, දකුණට : එම ඉඩමේම ලොට් 70 සහ 71 ද, බස්නාහිරට : ලොට් 65 ද, මායිම්ව අක්කර භාගයක පමණ වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති සියළු දේද වේ. එකී ඉඩම කුලියාපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 38/58 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම වඩා මෑතකදී කරන ලද මැනීමකට අනුව,

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල, හත්පත්තුවේ, මයුරාවතී කෝරළේ, රත්මලේ පිහිටි රත්මලේවත්ත ලෙස ප්‍රසිද්ධ සහ එනමැති ඉඩමට, බලයලත් මිනින්දෝරු එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් සාදන ලද 2002.11.24 දිනැති අංක. 3377 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපනය කර මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, එකී අංක. 3377 දරන පිඹුර ප්‍රකාර උතුරට : එෆ්. වී. පී. 927 හි ලොට් 43 වර්තමානයේ ගම්සභා පාර ද, නැගෙනහිරට : එෆ්. වී. පී. 927 හි ලොට් 63 වන දැනට පාවුලු ප්‍රනාන්දු උරුමකම් කියන ඉඩම ද, දකුණට : එෆ්. වී. පී. 927 හි ලොට් 70 වන දැනට කරුණාරත්න උරුමකම් කියන ඉඩම සහ එෆ්. වී. පී. 927 හි ලොට් 71 වන දැනට කමලාවතී උරුමකම් කියන ඉඩම ද, බස්නාහිරට : එෆ්. වී. පී. 927 හි ලොට් 65 දැනට ජයසේන උරුමකම් කියන ඉඩම ද, මායිම්ව හෙක්ටයාර් බිංදුවයි දශම එකයි අටයි නවයක (හෙක්. 0.189) නැතහොත් රූඩ් එකයි පර්චස් තිස්හතරයි දශම හතයි තුනක (අ. 0, රූ. 01, පර්. 34.73) වපසරියකින් යුක්තවන අතර එහි ඇති සියළු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි. එම්. එල්. කරුණාතිලක,
කළමනාකරු.

ලංකා බැංකුව,
කුලියාපිටිය ශාඛාව

09-395

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.05.22 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2007.12.17 දිනැති අංක 1321 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2009.03.18 දක්වා පොලිය ද, ණය ගිණුම මත රුපියල් දාහතර ලක්ෂ අනූහය දහස් අසූවයි ශත හැත්තෑ දෙකක (රු.14,96,080.72) මුදලක් සහ අයිරා ගිණුම මත රුපියල් එකොලොස් ලක්ෂ විසිහතර දහස් පන්සිය හැටයි ශත අනූතුනක් (රු.11,24,560.93) සමග ණය ගිණුම මත රුපියල් දහතුන්ලක්ෂයක (රු.13,00,000) මුදලක් සහ අයිරා ගිණුම මත රුපියල් දසලක්ෂයක (රු. 10,00,000) මත වසරකට සියයට විසිනවය (29%) සහ සියයට විසිහය (26%) බැගින් පොලියක් ද 2009.03.19 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සඳලංකාව ඉරබඩගම පදිංචි පෙරමුණු ගමගේ දොන් ඇන්ටනි බැසිල් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක. 1321 දරන බැඳුම්කරය මත අයවියයුතු ඉහත '1' හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්නල පාරේ, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, ඉරබඩගම පිහිටි "දූනකයා අත්ත අගාර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ඒ. එච්. ගුණතිලක විසින් සාදන ලද 2006.06.06 දිනැති අංක. 1461 ඒ දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 01 උතුරට : පී. බී. එල්. පෝල්ගේ ඉඩම ද, නැගෙනහිරට : මල්ලිකා ජයසිංහගේ ඉඩම ද, දකුණට : හෙන්රි කුරේරාගේ ඉඩම සහ බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් සාදන ලද අංක 1233 දරන පිඹුරෙහි ලොට් 6 වන අඩි 8 ක් පළල පාරක් සඳහා වෙන් කළ කොටස ද, බස්නාහිරට: ප්‍රාදේශීය සභා පාර ද, මායිම්ව රූඩ් එකයි පර්චස් දහතුනක (අ. 0, රූ, 1, පර්. 13) වපසරියකින් යුක්තවන අතර, එහි ඇති සියළු දේද වේ.

එකී ලොට් 1 පහත සඳහන් ඉඩම්වල එකතුවකි එනම්,

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, ඉරබඩගම පිහිටි "දූනකයා අත්ත අගාර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් සාදන ලද 1987.11.30 දිනැති අංක 1233 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් ලොට් 3, උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : අඩි 8 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද ලොට් 6 කොටස ද, බස්නාහිරට : වටරවුම් පාර ද මායිම්ව පර්චස් තිහයි දශම එකක (අ. 0, රූ. 0, පර්. 30.1) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති සියළු දේද වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S108/95 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, ඉරබඩගම පිහිටි "දූනකයා අත්ත අගාර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් සාදන ලද 1987.11.30 දිනැති අංක 1233 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා මායිම් නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට: ලොට් 2 ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : අඩි 8 ක් පළල පාරට වෙන්කළ කොටස වන ලොට් 6 ද, බස්නාහිරට : ලොට් 3 ද, මායිම්ව පර්චස් දොළහයි දශම එකක (අ. 0, රූ. 0, පර්. 12.1) වපසරියකින් යුක්ත

වන අතර, එහි ඇති සියළු දේද වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S71/286 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පිටිගල් කෝරළේ, කටුගම්පොල හත්පත්තුවේ, ඉරබඩගම පිහිටි "දුනකයා අත්ත අගාර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් සාදන ලද 1987.11.30 දිනැති අංක 1233 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා ඇති මායිම් නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට : ලොට් 2 ද, නැගෙනහිරට : මල්ලිකා ජයසිංහගේ ඉඩම ද, දකුණට: හෙන්රි කුරේට සහ අනෙක් අයට අයිති ඉඩම ද, බස්නාහිරට : ලොට් 4 සහ අඩි 8 ක් පළල පාරට වෙන්කළ කොටස වන, ලොට් 6 ද, මායිම්ව පර්චස් දාහතරයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 14.4) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති සියළු දේද වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S108/217 යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ජී. එස්. බී. විජේරත්න මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
පන්නල ශාඛාව.

09-393

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.12 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් එන්. පී. බී. චන්ද්‍රිකා මහත්මිය විසින් සහතික කරන ලද 2007.08.27 දිනැති අංක 1622 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.04.03 දින තෙක් පොලිය වශයෙන් රුපියල් විසිලක්ෂ පනස් හත් දහස් හයසිය විසිඑකයි ශත හතක (රු.20,57,621.07) මුදලක් සමග රුපියල් දහඅට ලක්ෂ හැත්තෑ හතර දහස් නවසිය පනහක (රු.18,74.950) මුදලක් මත වසරකට සියයට විසිනවය (29%) බැගින් පොලියක් ද, 2009.04.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ඇල්පිටිය, ඉගල්කන්ද හංදිය, "සීතල වතුර," හි පදිංචි උඩුගම සූරියගේ ප්‍රසාද් ධර්මසිරි මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක. 1622 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් විසිලක්ෂ පනස් හත් දහස් හයසිය විසිඑකයි ශත හතක (රු.20,57,621.07) මුදල සමග 2009.04.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මාතර, කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397) අධිකාරය හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුව, ඇල්පිටිය ශාඛාවේ, ශාඛා කළමනාකරුට ද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වලල්ලාවිටි කෝරළේ, ඇල්පිටිය බෙන්තොට ඉගල හි පිහිටි නුගේගොඩ කන්ද නමැති ඉඩමෙහි යා කරන ලද ලොට් 3 සහ 4 හි ලොට් 1 ලෙස දක්වා මායිම් නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 01 උතුරට : මිල්ලඒද්ණ්ඩ කුඹුරෙහි ඉතිරි කොටස ද, නැගෙනහිරට : අම්බලන්ගොඩ සිට ඇල්පිටිය දක්වා ප්‍රධාන පාර ද, දකුණට : පාර සහ බස්නාහිරට : ඉගලකන්ද වත්ත පාර ද මායිම්ව බලයලත් මිනින්දෝරු ටී. බී. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1977 දෙසැම්බර් 20 දිනැති අංක 295 ඒ දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) වපසරියකින් යුක්ත බිම් ප්‍රමාණය සමග එහි ඇති ගොඩනැගිලි, පස්, ගහකොළ වැවිලි ඇතුළු සියලු දේද වේ. මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 520/106 යටතේ ලියාපදිංචි කොට ඇත.

එස්. ඒ. ඩී. විමලසිරි,
කළමනාකරු.

ලංකා බැංකුව,
ඇල්පිටිය.

09-394

---

## රුහුණ සංවර්ධන බැංකුව - කඹුරුපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2008.08.28 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඌරාපොල නරසිංහගේ චන්ද්‍රලතා මහත්මිය විසින් සහතික කරන ලද 2007.08.21 දිනැති අංක 2311 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කඹුරුපිටිය, බොරළුකැටිය "සම්පත් " ලිපිනයේ පදිංචි සරත් කුමාර ජයතිලක දිසානායක යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කරය යටතේ රුපියල් එක් ලක්ෂ තිස් නවදහස් හයසියයක (රු. 1,39,600) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2008.09.22 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් එක්ලක්ෂ තිස්නමදහස් හයසියයක (රු. 1,39,600) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවාද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 2311 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තුවේ, කඹුරුපිටියේ, මලානේ පිහිටි සිරිබද්ධනගෙහේන බෙදා වෙන් කළ අංක

04 දරන කැබැල්ලට මානක ඩබ්ලි ගුණසේකර මහතා මැන සම්පාදිත අංක 299 හා 2003.08.07 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 01 දරන උතුරට: මෙම ඉඩමේ අංක 03 දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 06 දරන කැබැල්ල ද, පිඹුරු අංක 867 හි දැක්වෙන අංක 02 දරන කැබැල්ල ද, දකුණට : පිඹුරු අංක 867 හි දැක්වෙන අංක 03 දරන කැබැල්ල ද, බස්නාහිරට : උසාවි නියෝගය පරිදි මෙම ඉඩමේ අත්හල කොටස සහ උල්ලලට වැටෙන මාර්ගයට දිවෙන පාර ද, ය න මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් විසි පහයි දශම එක (අක්. 0, රූ. 01, පර්. 25.1) ක් විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළු දෙය ද වේ.

මෙම ඉඩම සී 639/219 හි ලියාපදිංචිව ඇත.

ප්‍රවේශ මාර්ගය බස්නාහිරින් පිහිටි මහා මාර්ගයේ සිට උල්ලලට දිවෙන පාරයි.

මෙම දේපල සී/630/227 වං 40/153 අංක යටතේ 2007.08.23 දින මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

අමරසේන ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 දෙසැම්බර් මස 30 වැනි දින.
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

09-315/1

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ (සංශෝධිත) 4 වැනි වගන්තිය යටතේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මාර්තු මස 24 වැනි දින පැවැත්වූ රැස්වීමකදී පහත සඳහන් වන අයුරු විශේෂයෙන් හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී :

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ඇල්ලෙපොළ (මහත්මිය) විසින් සහතික කරන ලද වර්ෂ 2001.04.03 වැනි දිනැති අංක 161 දරන බැඳුම්කරය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. කේ. වික්‍රමනායක (මහත්මිය) විසින් සහතික කරන ලද 2003.09.02 දිනැති අංක 244 දරන උකස් බැඳුම්කරය, 243 දරන පවරා දීමේ ඔප්පුව, 2004.08.03 දිනැති අංක 311 දරන උකස් බැඳුම්කරය සහ 2005.02.22 දිනැති අංක 406 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. කපුවත්ත (මහත්මිය) විසින් සහතික කරන ලද 2006.03.17 දිනැති අංක 632 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාලබේ පදිංචි උස්වත්ත ලියනගේ නිරංගා වීරසේකර (විවාහයට පෙර සිල්වා) (ණයට ගන්නා) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තව ද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (කලින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්) (බැංකුව) නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. එස්. ඉලංගකෝන් (මහත්මිය) විසින් සහතික කරන ලද 2005.02.22 දිනැති අංක 2423 දරන උකස් බැඳුම්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. ජයවර්ධන (මහත්මිය) විසින් සහතික කර ඇති 2006.08.31 දිනැති අංක 427 දරන පවරා දීමේ ඔප්පුව යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මාලබේ පදිංචි එකී උස්වත්ත ලියනගේ නිරංගා වීරසේකර (විවාහයට පෙර සිල්වා) සහ නිමල් චන්ද්‍ර වීරසේකර (ණයට ගන්නන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

තව ද වර්ෂ 2009 ක් වූ පෙබරවාරි මස 28 වැනි දිනට යථෝක්ත බැඳුම්කරයන් යටතේ බැංකුවට රුපියල් විසිහත් ලක්‍ෂ තිස් තුන් දහස් හාරසිය විසිහතයි ශත හැට නවය (රු. 27,33,427.69) ක මුදලක් අයවිය යුතුව හා ණයව පවතින බැවින් ද,

1995 අංක 24 දරන (සංශෝධිත) පනත මගින් සංශෝධනය කරන ලද 1990 අංක 4 දරන බැංකු මගින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ බැංකුවෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත පවරා ඇති බලතලවලට අනුව එකී රුපියල් විසි හත් ලක්‍ෂ තිස් තුන් දහස් හාරසිය විසිහතයි ශත හැට නවය (රු. 27,33,427.69) ක මුදල සහ විකිණීම කරන අවස්ථාව වන විට නොගෙවා ඉතිරිව ඇති කවර හෝ කොටසක් ද, වර්ෂ 2009 ක් වූ මාර්තු මස 01 වැනි දින සිට විකිණීම කරන දින දක්වා-

(අ) එකී අංක 161,243,244,311,406 සහ 632 දරන බැඳුම්කරයන් යටතේ මුල් මුදල වූ රුපියල් දාහතර ලක්‍ෂ අසූ හතර දහස් තුන්සිය හැට එකයි ශත පනහ (රු. 14,84,361.50) ක මුදල මත වසරකට සියයට විස්ස (20%) ක පොළිය ද,

(ආ) එකී අංක 2423 සහ 427 දරන බැඳුම්කරයන් යටතේ මුල් මුදල වූ රුපියල් එකොලොස් ලක්‍ෂ අසූදහස් හයසිය හැට නවය (රු. 11,80,669.00) ක මුදල මත වසරකට සියයට දහතුනක (13%) ක පොළිය ද, ප්‍රචාරය සහ විකිණීම සඳහා දරන්නට වන වියදම් ද ප්‍රධාන පනතේ 4 වන වගන්තියට අනුව දරා ඇති වෙනත් වියදම් ද මෙතැන් සිට ලබා ගන්නා කිසියම් ගෙවීමක් (එවැන්නක් ඇත්නම්) ඇත්නම් එය ද අඩුකර ආපසු අයකර ගැනීම පිණිස එකී බැඳුම්කරයන් මගින් බැංකුවට උකස් කර ඇති මෙහි පහත විස්තර කරනු ලබන දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට පනතේ ඔවුන් වෙත පවරා ඇති බලතලවලට අනුව බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ වූ බත්තරමුල්ල ඒකකය තුළ වූ තලංගම උතුරේ පිහිටි පොතු ආරව පාරේ වරිපනම් අංක 472/958 (කලින් අංක 472/28) දරන පරිශ්‍රය සහ එහි පිහිටි ගහකොළ වගාවන් ඇතුළු සියලු දේද සමග වන කැකුණගහවත්ත යනුවෙන් හඳුන්වන ඉඩමෙහි බලයලත් මානක ඒ හෙට්ටිගේ විසින් සාදන ලද 2000.07.29 දිනැති අංක 2873 දරන පිඹුරෙහි ලොට් 14 ලෙස ලකුණු කර ඇති බෙදා වෙන්කල ඉඩම් කොටස (බලයලත් මානක බී. කේ. පී. ඔකඳපොළ විසින් සාදන ලද 1994.12.11 දිනැති අංක 249/94 දරන පිඹුරෙහි ලොට් 1A ලෙස ලකුණු කර ඇති ඉඩමේ නැවත බෙදීමක් සහ නැවත මැනීමක් වන) උතුරට : ලොට් 12 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන්කර ඇති) න් ද, නැගෙනහිරට : ලොට් 15න් ද, දකුණට : ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කරන ක්‍රීඩා පිටියෙන්ද බටහිරට : ලොට් 13න් ද මායිම් වන අතර ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 12.5) ක් හෝ

හෙක්ටයාර 0.0316ක් වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1266/216 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

09-356

---

හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - හෙට්ටිවීදිය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී:-

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ක්‍රිෂ්කෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමට සපයන ලද ණය මුදල් ආපසු ගෙවන බවට සුරකුමක් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2003.07.02, 2004.11.22 සහ 2005.10.11 දිනැති පිළිවෙලින් අංක 928, 1310 සහ 1629 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ක්‍රිෂ්කෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන අය ණයකරු හැටියට සහ කනපතිපිල්ලේ සුබ්‍රමානියම් සහ නාගේස්වරී සුබ්‍රමානියම් යන අය උකස්කරුවන් හැටියට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කර ඇති හෙයින් සහ ඉහත කී කනපතිපිල්ලේ සුබ්‍රමානියම් සහ නාගේස්වරී සුබ්‍රමානියම් යන අයවලුන් එකී ක්‍රිෂ්කෝ ඉන්ටර්නැෂල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සියලු සහ සමස්ත කොටස් හිමි බැවින් ද සහ ඉහත කී කනපතිපිල්ලේ සුබ්‍රමානියම් සහ නාගේස්වරී සුබ්‍රමානියම් අයවලුන් ඉහත කී ක්‍රිෂ්කෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂවරු වශයෙන් එම සමාගමේ පාලනය හා කළමනාකරණය දරන අතර ඒ අනුව එකී කනපතිපිල්ලේ සුබ්‍රමානියම් සහ නාගේස්වරී සුබ්‍රමානියම් යන අය ඉහත කී ක්‍රිෂ්කෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අයිතිකරුවන් හා පාලනය දරන තැනැත්තන් වන අතර, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් ක්‍රිෂ්කෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පිළිසරණයන්හි නියම අර්ථලාභීන් එකී කනපතිපිල්ලේ සුබ්‍රමානියම් සහ නාගේස්වරී සුබ්‍රමානියම් යන අයවලුන් වන හෙයින් ද,

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතු මුදල් ආපසු ගෙවීම එකී ක්‍රිෂ්කෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සහ කනපතිපිල්ලේ සුබ්‍රමානියම් සහ නාගේස්වරී සුබ්‍රමානියම් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පනස්පන් ලක්ෂ අනූපන්දහස් පන්සිය තිස් නවයයි ශත එකොළහ (රු. 55,95,539.11) ක මුදලක් 2009.06.30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 55,95,539.11ක මුදලට 2009.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 928, 1310 සහ 1629 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාව තුළ බම්බලපිටිය, වසම් අංක 38 දරන කොල්ලුපිටිය, අබ්දුල් ගෆූර් මාවතේ පිහිටි (කලින් පෙන්ඩෙනිස් ඇවනිව්) අබ්දුල් ගෆූර් මාවතේ, වරිපනම් අංක 12ඒ දරන ඉඩම වන බලයලත් මානක එල්. ඒ. එච්. රාජකාරියර් විසින් පිළියෙල කරන ලද 1971.07.25 වැනි දින අංක 3279 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් අංක 3 දරන කොටස වන උතුරට : පෙන්ඩෙනිස් ඇවනිව් වලින් ද, නැගෙනහිරට : පෙන්ඩෙනිස් ඇවනිව්, වරිපනම් අංක 14න් ද දකුණට : ලොට් අංක 4න් ද සහ බස්නාහිරට : ලොට් අංක 10න් ද මායිම් වූ එකී අංක 3279 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හය (අ. 0, රූ. 0, පර්. 6)ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1026/112 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත ඉඩම නැවත මැනීමකට අනුව මෙසේ විස්තර වේ :

ඉහත කී අබ්දුල් ගෆූර් මාවතේ පිහිටි අබ්දුල් ගෆූර් මාවතේ, වරිපනම් අංක 12ඒ දරන බලයලත් මානක එස්. ඒ. ගුණවර්ධන විසින් පිළියෙල කරන ලද 1982.02.11 වැනි දින අංක 131 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 දරන කොටස වන උතුරට : අබ්දුල් ගෆූර් මාවතෙන් ද, නැගෙනහිරට : අබ්දුල් ගෆූර් මාවතේ වරිපනම් අංක 14න් ද, දකුණට : ලොට් අංක 2න් ද සහ බස්නාහිරට : ලොට් අංක 7න් ද මායිම් වූ එකී අංක 131 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හය (අ. 0, රූ. 0, පර්. 6) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමග වේ.

ඉහත කී ඉඩම මෑතකදී බලයලත් මානක පී. ෆීලික්ස් ඩයස් විසින් 1997.06.01 වැනි දින අංක 993 දරන පිඹුර ප්‍රකාරව කරන ලද මැනීමකට අනුව මෙසේ විස්තර වේ :

ඉහත කී අබ්දුල් ගෆූර් මාවතේ පිහිටි අබ්දුල් ගෆූර් මාවතේ, වරිපනම් අංක 12ඒ දරන බලයලත් මානක පී. ෆීලික්ස් ඩයස් විසින් පිළියෙල කරන ලද 1997.06.01 වැනි දින අංක 993 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 දරන කොටස වන උතුරට : අබ්දුල් ගෆූර් මාවතෙන් ද, නැගෙනහිරට : අබ්දුල් ගෆූර් මාවතේ, වරිපනම් අංක 14 දරන පරිශ්‍රයෙන් ද, දකුණට : අංක 131 පිඹුරේ ලොට් අංක 2න් ද සහ බස්නාහිරට : අංක 131 පිඹුරේ ලොට් අංක හතෙන් ද (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) මායිම් වූ එකී අංක 993 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයයි දශම දෙකයි හත (අ. 0, රූ. 0, පර්. 6.27)ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

එකී අංක 928, 1310 සහ 1629 දරන බැඳුම්කරයන්හි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/13

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - තලංගම ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.01.11 දිනැති සහ අංක 3606 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලිස්වින් ඉන්වෙස්මන්ට් ලිමිටඩ් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් එකසිය හතලිස්අටලක්ෂ අසූදෙදහස් දෙසිය හැටපහයි ශත අසූඅට (රු. 1,48,82,265.88) ක මුදලක් 2008.12.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,48,82,265.88ක මුදලට 2009.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3606 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එස්. මනම්පේරි මහත්මිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාවේ, කොහුවල කොට්ඨාස අංක 3හි නැගෙනහිර කළුබෝවිල එස්. ඩී. එස්. ජයසිංහ මාවතේ, වරිපනම් අංක 142/2 හි වැල්ලබොඩවත්ත නමැති ඉඩමට බලයලත් මානක එන්. ඩී. ද කොස්තා විසින් 1980.06.29 දින මැන සාදන ලද පිඹුරු අංක 486හි අංක බී1ජී නමැති ඉඩමෙහි උතුරට : එස්. ගුණරත්නට අයිති ඉඩමෙන් සහ පිඹුරු අංක 449හි ලොට් අංක බී්ඩී ද, නැගෙනහිරට : පිඹුරු අංක 486හි බී1ජේ සහ බී1එන් ද, දකුණට : පිඹුරු අංක 486හි ලොට් අංක බී11න් ද සහ බටහිරට : ඇලෙන් ද මායිම් වූ පර්චස් දහඅටයි දශම දෙකයි තුන (අ. 0, රූ. 0, පර්. 18.23) ක් විශාල ඉඩම, ගොඩනැගිලි සහ සියලුදේත් සමග වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3005/85 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක කේ. වී. එම්. ඩබ්. සමරනායක විසින් 2006.10.25 වැනි දින මැන සාදන ලද අංක 3024 දරන පිඹුර නැවත මැනීමකට අනුව පහත පරිදි වේ :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාවේ කොහුවල කොට්ඨාස අංක 3හි නැගෙනහිර කළුබෝවිල එස්. ඩී. එස්. ජයසිංහ මාවතේ වරිපනම් අංක 142/2හි වැල්ලබොඩවත්ත නමැති ඉඩමට බලයලත් මානක එන්. ඩී. ද කොස්තා විසින් 1980.06.29 දින මැන සාදන ලද පිඹුරු අංක 486හි අංක 1 නමැති ඉඩමෙහි උතුරට : එස්. ගුණරත්නට අයිති ඉඩමෙන් ද පිඹුරු අංක 449හි ලොට් අංක බී්ඩී න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 449හි බී්ඩී සහ මීටර් 3.6ක් දිග පාරෙන් (පිඹුරු අංක 486හි ලොට් අංක බී1ජේ) න් මීටර් 3.6ක් දිග පාරෙන් (පිඹුරු අංක 486හි ලොට් අංක බී1ජේ) වරිපනම් අංක 42/1 සහ එස්. ඩී ජයසිංහ මාවතේ (පිඹුරු අංක 486හි ලොට් අංක බී1එෆ් වලින්) සහ පිඹුරු අංක 486හි ලොට් අංක බී1එච් වලින් ද, දකුණට : පිඹුරු අංක 486හි ලොට් අංක බී11න් සහ බටහිරට : නගර සභා කාණුවෙන් ද මායිම් වූ පර්චස් දහහත (අ. 0, රූ. 0, පර්. 17) ක් විශාල ඉඩම, ගොඩනැගිලි සහ සියලුදේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/14

---

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කහවත්ත ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. ඩී. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.05.09 සහ 2007.09.05 දින හා පිළිවෙලින් අංක 120 සහ 218 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දසනායක මුදියන්සේලගේ දහනායක සහ දසනායක මුදියන්සේලාගේ පෙමුදු දීවන්ති දසනායක යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පනස්තුන් ලක්ෂ හැත්තෑතුන්දහස් හාරසිය තිස්හතරයි ශත නමය (රු. 53,73,434.09) ක මුදලක් 2009.03.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 53,73,434.09ක මුදලට 2009.04.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 120 සහ 218 දරන උකස් බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව නගර සභා සීමාව තුළ ඇරැව්වල ගමේ පිහිටි

මාරගහවත්ත නොහොත් කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එන්. පී. ඇල්විටිගල විසින් සකස් කරන ලද 2005.06.29 දින සහ අංක 2549 දරන පිඹුරේ ලොට් අංක 2 දරන ඉඩම් කොටසට, උතුරට : පිඹුරු අංක 2709හි ලොට් අංක 1න් සහ අශෝක පරනවිතාරනට අයිති ඉඩමෙන් ද, නැගෙනහිරට : කැබැල්ලගහ කුඹුර සහ පිඹුරු අංක 2709හි ලොට් අංක 3න් ද, දකුණට : කැබැල්ගහ කුඹුර, පිඹුරු අංක 2709හි ලොට් අංක 3 සහ පිඹුරු අංක 2549හි ලොට් අංක 1න් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 2709හි ලොට් අංක 1න් ද මායිම් වූ පර්චස් දොලහ (අ. 0, රූ. 0, පර්. 12)ක් විශාලත්වය ඇති ඉඩම, ගොඩනැගිලි සහ සියලුදේත් සමග වේ. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2774/260 යටතේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මානක එන්. පී. ඇල්විටිගල විසින් මැන සාදන ලද අංක 2005.06.29 දින සහ අංක 2549 දරන පිඹුරේ ලොට් අංක 3 දරන මාර්ගය මතින් (අඩි 10 පළල) මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/10

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - ඇල්පිටිය ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2009.07.23 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

ඇල්පිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. මහගොඩගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි නමට ලියන ලද්දාවූ ද 2007.12.31 දින හා අංක 5682 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉලන්දාරි දේව විජේසිරි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ හැත්තෑනමදහස් පන්සිය හැත්තෑනමයයි ශත පනස්අට (රු. 5,79,579.58) ක මුදලක් 2008.10.31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 5,79,579.58ක මුදලට 2008.11.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 5682 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තා වූද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එච්. දළුවත්ත මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වෙල්ලබඩ පත්තුවේ, බටපොල කිරිමැටිය, කිරිමැටිය එස්ටේට් දරන ඉඩමට බයලත් මානක පී. එච්. ඩී. සිල්වා විසින් මැන සාදන ලද අංක 586 දරන පිඹුරෙහි ලොට් අංක 26 දරන කොටස වන ඊසානදිගට : මෙම ඉඩමේම ලොට් අංක 25න් ද, ගිණිකොණට : ඇල්පිටිය-බටපොල ප්‍රධාන මාර්ගයෙන් ද, නිරිතදිගට සහ වයඹට : මෙම ඉඩමේම ලොට් අංක 19න් මායිම් වූ පර්චස් නමයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 9.5) ක් විශාල ඉඩම, පස, ගහකොළ, ගොඩනැගිලි සහ සියලුදේත් සමග වේ. මෙම ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 707/223 යටතේ ලියාපදිංචි වී ඇත.

මෙම ඉඩම නැවත මැනීමකට අනුව පහත පරිදි වේ :-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වෙල්ලබඩ පත්තුවේ, බටපොල, කිරිමැටිය, කිරිමැටිය එස්ටේට් දරන ඉඩමට බලයලත් මානක ඩී. එම්. සිරිපාල විසින් මැන සාදන ලද 2007.07.05 දිනැති සහ අංක 3272 දරන පිඹුරෙහි ලොට් 26 දරන කොටස වන උතුරට : ලොට් අංක 25න් ද, නැගෙනහිරට : බටපොල-කුරුඳුගහ හැතැක්ම ප්‍රධාන මාර්ගයෙන් ද, දකුණට සහ බටහිරට : ලොට් අංක 19 න් මායිම් වූ පර්චස් නමයයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 9.5) ක් විශාල ඉඩම පස, ගහකොළ, ගොඩනැගිලි සහ සියලු දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රානි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

09-456/9

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

1. මහජන නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2008.08.07 දිනැති අංක 1397 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.04.03 දින තෙක් පොලිය වශයෙන් රුපියල් විසිලක්ෂ අනූඅට දහස් තුන්සිය හතලිස් එකයි ශත අනූහතක (රු.20,98,341.97) මුදලක් සහ රුපියල් එක්ලක්ෂ හතලිස් තුන් දහස් නවසිය විසිපහයි ශත තිස්අටක (රු.1,43,925.38) මුදලක් සමග රුපියල් දහනවලක්ෂ අසූදහසක (රු.19,80,000) මුදලක් සහ රුපියල් එක්ලක්ෂ හතලිස් තුන්දහස් හාරසිය හතලිස් තුනයි ශත පනස් නවයක (රු.1,43,443.59) මුදලක් මත වසරකට සියයට විසිනවය (29%) සහ සියයට අට (8%) බැගින් පොළියක් ද, 2009.04.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොල්ගහවෙල, අලව්ව හන්දිය, "ප්‍රාර්ථනා කැෆේ" හි පදිංචි සෙනෙවිරත්න මුදියන්සේලාගේ ආරියපාල මහතා සහ රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රාවතී රත්නායක මහත්මිය යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත. (2009.07.08 වැනි දිනට තැන්පත් කළ මුදල රු. 54,712.60).

2. එකී අංක. 1397 දරන බැඳුම්කරය මත අයවිය යුතු ඉහත "1" හි සඳහන් මුදල සමග විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි, පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්නල පාරේ, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩපොල මැදලස්ස කෝරළේ නැගෙනහිර, බැවිල්ගමුව, කොහොඳපොල දෙඹේගොඩ සහ ගලටොඹුව ගම්වල පිහිටි "තියඩෝර් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1997.04.18 දිනැති අංක 70/97 දරන පිඹුරෙහි ලොට්අංක 1A ලෙස නිරූපනය කර මායිම් නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ඉඩම ඊසානදිගට : ලොට් 2 ද, ගිණිකොණට : ලොට් 1C සහ 1B ද, නිරිතට : රඹුක්කන දක්වාවූ ප්‍රධාන පාර සහ ලොට් 1B ද, වයඹට : කොළඹ සිට කුරුණෑගල දක්වාවූ ප්‍රධාන පාර සහ රඹුක්කන දක්වාවූ ප්‍රධාන පාර ද මායිම්ව පර්චස් දොලහයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 12.25) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති අනෙකුත් සියළු දේද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 1157/252 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

මෙකී ඉඩම මෑතකදී සාදනලද මැනීමකට අනුව, ඉහත කී බෙවිල්ගමුව, කොහොඳපොල දෙඹේගොඩ සහ ගලටොඹුව ග්‍රාමයන්හි පිහිටි "තියඩෝර් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එන්. කරුණාතිලක විසින් සාදන ලද 2006.12.13 දිනැති අංක 1887 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නිරූපනය කර ඇති අතර, එකී ඉඩම ඊසානදිගට : බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද 1997.04.18 දිනැති අංක 70/97 දරන පිඹුරෙහි ලොට් 2 ද, ගිනිකොණට : අංක 70/97 දරන පිඹුරෙහි ලොට් 1C සහ 1B ද, නිරිතට : රඹුක්කන දක්වාවූ ප්‍රධාන පාර ද සහ ලොට් 1B ද, වයඹට : කොළඹ සිට කුරුණෑගල දක්වාවූ ප්‍රධාන පාර සහ රඹුක්කන දක්වාවූ ප්‍රධාන පාර ද මායිම්ව පර්චස් දොලහයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 12.25) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති අනෙකුත් සියලු දේද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බී. එම්. එල්. පී. බස්නායක,
කළමනාකරු.

ලංකා බැංකුව,
පොතුහැර ශාඛාව.

09-446

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0068 5000 0997.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ ජූලි මස 28 වෙනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී :

සමාගම් අංක පී. කිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් වන අයි. අයි. ආර්. වේරගොඩ යන අය විසින් ලියා සහතික කරන ලද 2006 නොවැම්බර් මස 23 දාතම හා අංක 411 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගම්පහ, විජය පාර, අංක 50/2, හි පදිංචි ගාමිණී වික්‍රමසේකර යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් හත්ලක්ෂ අනූපන් දහස් හාරසිය අසූතුනයි ශත තිස්අටක (රු.57,95,483.38) මුදලක් 2009 ජූලි 10 වැනි දිනට එකී සම්පත් බැංකුව පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස් හත් ලක්ෂ අනූපන්දහස් හාරසිය අසූ තුනයි ශත තිස් අට (රු. 57,95,483.38) මුදල ද, 2009 ජූලි 11 දින සිට අංක 411 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් තුන්ලක්ෂ අනූතුන් දහස් හත්සිය හතලිස් දෙකයි ශත විසිඑකක(රු.53,93,742.21) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවක් (15%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 411 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ නගර සභා සීමාවන් තුළ, (යක්කල උප කාර්යාලය) කෙසෙල්වතුගොඩ ග්‍රාමයේ පිහිටි කුරුණෑගල වත්ත පාර, වරිපනම් අංක 39-41 දරන "යක්කල එස්ටේට් හි කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. පී. එන්. ජයසුන්දර විසින් සාදන ලද 2006 ඔක්තෝබර් 15 දාතම හා අංක 6210 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : නිහාල් ඩික්සන් රාජපක්ෂ සහ එඩ්වඩ් රනිල් ජයතිලක යන අයගේ උරුමක්කාරයින්ගේ සහ අඟුරු හෙට්ටිආරච්චිලාගේ උපාලි යන අයගේ ඉඩම්, නැගෙනහිරට : එඩ්වඩ් රනිල් ජයතිලක සහ නිහාල් ඩික්සන් රාජපක්ෂ යන අයගේ උරුමක්කාරයින්ගේ ඉඩම සහ පාර (මහ නගර සභා), දකුණට : පාර (මහ නගර සභා) සහ පාර (අඩි 10 හෝ මීටර් 3.05 පළල) සහ බස්නාහිරට : පාර (අඩි 10 හෝ මීටර් 3.05 ක් පළල) සහ කේ. කේ. කේ. විජේසුන්දර සහ වෙනත් අයගේ සහ අඟුරු හෙට්ටිආරච්චිලාගේ උපාලි යන අයගේ ඉඩම් යන මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් තිස් පහයි දශම හයක් (0A., 1R., 35.6P.) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 6210 ට අනුව වෙළුම/පත්ඉරුව ජී 49/132 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-432/15

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් සහ 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.07.23 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී :

1. ගාල්ල මහජන නොතාරිස් ප්‍රේමරත්න තිරානගම මහතා විසින් සහතික කරන ලද 2008.02.08 දිනැති අංක 5996 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.06.17 දින තෙක් පොලිය වශයෙන් රුපියල් දෙලක්ෂ එකොළොස් දහස් හාරසිය පනස් තුනයි ශත තිස්එකක (රු.2,11,453.31) මුදලක් සමග රුපියල් එක්ලක්ෂ හැටතුන් දහස් තුන්සිය විස්සක (රු. 1,63,320) මුදලක් මත වසරකට සියයට විසිනවය(29%) බැගින් පොළියක් ද, 2009.06.18 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් වඳුරඹ, කිඹිකන්ද හි පදිංචි ප්‍රබෝධ මනෝහර ජයවර්ධන මහතා සහ ඔලි දූරගේ සුනීතා කාන්ති නුගවත්ත යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක. 5996 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දෙලක්ෂ එකොළොස් දහස් හාරසිය පනස් තුනයි ශත තිස්එකක (රු.2,11,453.31) මුදල සමග 2009.06.18 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මාතර, කොටුව, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද, සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, ගාල්ල කඩවීදිය අධිශ්‍රේණි ශාඛාවේ, ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, තල්පෙපත්තුවේ, මීගහගොඩ පිහිටි බටලුකනත්තෙහි ලොට් B හි සීමා නිර්ණය කර ඇති බෙදූ ලොට් අංක 16, එනම් එකී ලොට් අංක 16, උතුරට : එම ඉඩමේම ලොට් අංක 15 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 13 ද, දකුණට : එම ඉඩමේ ලොට් අංක 17ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 19 ද මායිම්ව බලයලත් මිනින්දෝරු එන්. විජේවීර විසින් සාදන ලද 1998 ජනවාරි 25 දිනැති අංක 3416 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාහතයි දශම පහක (අ. 0, රූ.0, පර්. 17.5) වපසරියකින් යුක්තවන අතර, ඒ සමගම එයට ගාලු දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D/733/290 හි පාරට වෙන්කළ කොටස ලෙස ලියාපදිංචි ඉහත කී පිඹුරෙහි දක්වා ඇති මාර්ගයේ අයිතිය ද ඇත. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D/937/121 හි ලියාපදිංචි කර ඇත.

ඒ සමගම මෙයට එම ඉඩමේ ලොට් අංක 13 (ප්‍රවේශ මාර්ගය) මතින් සහ ඒ දිගට අයිතිය ද ඇත.

ටී. වී. එස්. වසන්ත,<br>ජ්‍යෝෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,<br>ගාල්ල කඩවීදිය අධිශ්‍රේණි ශාඛාව.

09-444

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.07.09 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් එන්. පී. ජී. චන්ද්‍රිකා විසින් සහතික කරන ලද 2008.07.25 දිනැති අංක 1871 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.06.12 වෙනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් තිස්දෙලක්ෂ අනූඅටදහස් නවසිය හැටහතයි, ශත පනස් එකක (රු.32,98,967.51) මුදලක් සමග රුපියල් විසිඅටලක්ෂ දෙදහස් හාරසිය අනූවක (රු.28,02,490) ක මුදලක් මත වසරකට සියයට විසිනවය (29%) බැගින් පොළියක් ද, 2009.06.13 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තොටගොඩ, 301/ඒ හි පදිංචි දිනේෂ් ලක්මාල් ගොඩගේ මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1871 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තිස්දෙලක්ෂ අනූඅටදහස් නවසිය හැටහතයි ශත පනස් එකක (රු.32,98,967.51) මුදල සමග 2009.06.13 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මාතර - කොටුව - විල්ප්‍රඩ් ගුණසේකර මාවතේ, අංක 39 හි පදිංචි එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට කොග්ගල, ලංකා බැංකු ශාඛාවේ ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාල්ල මහ නගර සභාවේ සහ ගාල්ල සතර මායිම තුළ ලබුදූවෙහි පිහිටි බලයලත් මිනින්දෝරු ෂෙල්ටන් ඩබ්. පීරිස් විසින් සාදන ලද 2007 ජූලි 05 දිනැති අංක 3004 දරන පිඹුරෙහි නිරූපිත ප්‍රාන්ලැන්ඩ්වත්තෙහි ලොට් 4A හි සීමා නිර්ණය කර බෙදූ ලොට් 4A, උතුරට : එම ඉඩමේ ලොට් 03 ද, නැගෙනහිරට : කාණුව සහ මොරිස් පාරද, දකුණට : ලොට් 4B ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 02, මායිම්ව පර්චස් එකොළහයි දශම දෙකක (අ. 0, රූ. 0, පර්. 11.2) වපසරියකින් යුක්ත වන අතර, එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේද වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A639/216 හි ලියාපදිංචි කර ඇත.

යූ. කඩහෙට්ටි,<br>කළමනාකරු.

ලංකා බැංකුව,<br>කොග්ගල.

09-447

### සම්පත් බැංකුව පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0013 5001 2768.

2008 ජූලි මස 24 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමේදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහරගම, පමුණුව පාරේ අංක 292/2ඒ, හි මුදිත උදාර සාලිය ගාමිණී තිලකවර්ධන යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ සමාගම් අංක පීකිව් 144 දරන දැනට සම්පත් බැංකුව පීඑල්සී නමින් හැඳින්වෙන සීමාසහිත සම්පත් බැංකුව නමට ලියා සහතික කළ 2000 පෙබරවාරි 22 දාතම හා අංක 996 දරන හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් එසේ සහතික කළ 2005 ජූනි 16 දාතම හා අංක 871 දරන උකස් බැඳුම්කරය මගින් උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම පැහැර හැරීමේ හේතුවෙන් 2008 පෙබරවාරි මස 26 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හත්ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය විසිනවයකුත් ශත හැත්තෑ හයක (රු. 7,74,129.76ක් පමණයි) මුදලක් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත අයවිය යුතුව හිඟව ඇති හෙයින් හත්ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය විසිනවයකුත් ශත හැත්තෑ හයක (රු. 7,74,129.76 ක් පමණයි) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් හත් ලක්ෂ හැට දෙදහස් අටසිය අනූවකුත් ශත අනූහතක (රු. 7,62,890.97ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාසය (16%) බැගින් 2008 පෙබරවාරි මස 27 වැනි දින සිට එකී අංක 996 සහ 871 දරන බැඳුම්කර මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල ගෙවා/පියවා නිමාකරන දින තෙක් තවදුරටත් පොලියද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 996 සහ 871 දරන බැඳුම්කර මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය, මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

#### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ නාගරික කොට්ඨාස අංක 36 කුරුඳුවත්තෙ පිහිටි රෝස්මීඩ් පෙදෙසේ වරිපනම් අංක 18 දරන බලයලත් මිනින්දෝරු ඒ. ඩී එම්. ජේ. රූපසිංහ විසින් මැන සාදන ලද 1989 අගෝස්තු 30 දාතම හා අංක 918 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 1065/31 යටතේ ලියාපදිංචි කළ එකී අංක 918 පිඹුරට අනුව උතුරට : රෝස්මිඩ් පෙදෙස ද, නැගෙනහිරට : අංක 17/1977 (සීසීඑච්/13/1032/20) දරන පිඹුරේ ලොට් 1 හා 2 ද, දකුණට : රෝස්මිඩ් පෙදෙසේ වරිපනම් අංක 16 දරන දේපළ ද සහ බටහිරට : රෝස්මිඩ් පෙදෙසේ වරිපනම් අංක 16 දරන පරිශ්‍රයද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම තුනයි පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 1.35) වන බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන් මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමගය.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-432/1

---

### සම්පත් බැංකුව පීඑල්සී
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වුණ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0072 5000 0752.

2009 ජූනි මස 04 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමේදී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බලපිටිය දුම්රියපල පාරේ අංක 37 හි වවුලගල ජනත් කුමාර මෙන්ඩිස් යන අය බන්ධනදායී වශයෙන් මාතර ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එස්. පරණමාන විසින් සමාගම් අංක පීක්‍යු 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමට ලියා සහතික කළ 2007 මාර්තු 21 දාතම හා අංක 946 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම/පියවීම පැහැර හැර ඇති හෙයින් 2009 මාර්තු 19 වැනි දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසි දෙලක්ෂ දාහතර දහස් හයසිය හතරකුත් ශත හැත්තෑ එකක් (රු. 22,14,604.71ක් පමණයි) එකී බැඳුම්කරය මත ඉහත කී සම්පත් බැංකුව පීඑල්සී වෙත අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් විසි දෙලක්ෂ දාහතර දහස් හයසිය හතරකුත් ශත හැත්තෑඑකක් (රු. 22,14,640.71ක් පමණයි) මුදල සමග තවත් රුපියල් දහඅට ලක්ෂ හතලිස් එක් දහස් නවසිය විසි නවයකුත් ශත හතලිහක (රු. 18,41,929.40ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාසය (16%) බැගින් 2009 මාර්තු මස 20 වැනි දින සිට එකී අංක 946 දරන බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල ගෙවා/පියවා නිමාකරන දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 946 දරන බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සීමාසහිත සම්පත් බැංකුවට වෙත උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය, මහනුවර බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

#### ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ අම්බලන්ගොඩ කරිත්තකන්දේ පිහිටි කරිත්තකන්ද උස්වත්තේ ලොට් 1 හි

උපබෙදුම නමින් හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ටී. බර්ට් ඒ ද සිල්වා විසින් සාදන ලද 2006 ජූලි මස 12 දාතම හා අංක 7529 ඒ දරන පිඹුරේ ලොට් 1එෆ් ලෙස ලකුණු කොට නිරූපිත බලපිටිය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ඒ 262/28 හි ලියා පදිංචි කර ඇති එකී අංක 7529ඒ පිඹුරට අනුව උතුරට : එම ඉඩමේම ලොට් 1 ඒ සහ 1බී ද ; නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 1සී සහ 1ජී ද, දකුණට : ලොට් 1ජී සහ පන්සලේ වත්ත ද සහ බටහිරට : පන්සලේ වත්ත සහ එම ඉඩමේම කොටසක් ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම බිංදුවයි හතරක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 7.04) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන් මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්ව ද සමගය.

ඒ සමගම එකී අංක 7529ඒ පිඹුරේ නිරූපිත සීමා නිර්නය කළ ලොට් 1සී මතින් යටින් හා ඔස්සේ ධාවනය සඳහා පිළියෙල කොට ඇති හෝ නැති පා ගමනින් හා වාහනවලින් යාමේ මාර්ග අයිතිය සහ විදුලි හා විදුලි සංනිවේදන රැහැන් ඇදීමේ, ජලාපවාහන, මලාපවහන හා ජලනල ඇතිරීමේ සහ වෙනත් පහසුකම් සැලැසීමේ අයිතිය ද හා සමගය.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-432/3

---

## රුහුණු සංවර්ධන බැංකුව - කඹුරුපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණු සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

2008.08.28 දින පවත්වන ලද රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණු සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී වික්‍රමසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2005.03.22 දිනැති අංක 3926 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කඹුරුපිටියේ, නාරන්දෙනිය, බඳුවත්ත, "ප්‍රභාත්" ලිපිනයේ පදිංචි කලුපහනගේ මංගල කලුපහන සහ පූර්ණිමාලා කළුආරච්චිගේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් අසූපන්දහස් හත්සියයක (රු. 85,700) මුදලක් රුහුණු සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2008.08.14 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් අසූපන්දහස් හත්සියයක (රු. 85,700) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ද ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 3926 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

#### දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තුවේ, නාරන්දෙනියේ පිහිටි කෝන්ගහවත්ත හෙවත්, ඉලන්කෝන්වත්ත හෙවත් බඳුවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කළ "ඊ" අක්ෂරය දරන කැබැල්ලෙන් බ. මි. යූ. එස්. අතපත්තු මහතාගේ අංක : 1183/1981.06.20 දින දරන සැලැස්ම ප්‍රකාර බෙදා වෙන් කළ අංක 01 දරන කැබැල්ල ද, උතුරට : පාර ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 02 දරන කැබැල්ල ද, දකුණට : කැටකාලවත්ත ද, බස්නාහිරට : මුල් ඉඩමේ ඩී අක්ෂරය දරන කැබැල්ල ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසි නවයයි දශම පහයි පහක් (අ. 0, රූ. 0, පර්. 29.55) ක් විශාල ඉඩමත්, ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු යනාදී සියලුම දේ සම්පූර්ණයෙන් ද වේ.

මෙම ඉඩම සී 488/207 හි ලියාපදිංචිව ඇත.

මෙම දේපළ සී/488/298 වං 33/366 අංක යටතේ 2005.03.23 දින මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අමරසේන ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 අගෝස්තු මස 28 වැනි දින,
රුහුණු සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන, මාතර.

09-315/2

---

## මහජන බැංකුව - කුරුණෑගල ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් වයි. පී. කේ. තෙන්නකෝන් මිය විසින් සහතික කරන ලද 2008.03.10 දිනැති අංක. 6376 සහ 6378 දරන උකස්කරය මත, සීමාසහිත සුදිත් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් කොන්ක්‍රීට් වර්ක්ස් (පුද්ගලික) සමාගම (අධ්‍යක්ෂවරු : ලොකු කුලකුල ජයසූරිය පටබැඳිආරච්චිලාගේ සුදිත් නාලක ක්‍රිශාන්ත පෙරේරා සහ සරුක්කාර විදාන ආරච්චිලාගේ ශ්‍යාමා ප්‍රියන්ති) විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්ද, එකී උකස්කර යටතේ රුපියල් හතළිස් එක් ලක්ෂ හැට හය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක් (රු.41,66,666.70) සහ රුපියල් ලක්ෂ විසි පහක් (රු.25,00,000) ක් දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, රුපියල් හතළිස් එක්ලක්ෂ හැට හය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක් (රු.41,66,666.70) සහ රුපියල් ලක්ෂ විසි පහක් (රු.25,00,000) මුදලක් සඳහා 2009.02.15 දින සිට සියයට විසි හය (26%) බැගින් පොලිය ද, රුපියල් ලක්ෂ විසි පහක (රු.25,00,000) මුදලක් සඳහා 2008.12.19 දින සිට සියයට විසි හතක් (27%) බැගින් සහ වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක්

ලැබී ඇතිනම් ඒවා අඩුකර, රුපියල් හතලිස් එක්ලක්ෂ හැට හය දහස් හයසිය හැට හයයි ශත හැත්තෑවක් (රු.41,66,666.70) සහ රුපියල් ලක්ෂ විසි පහක (රු.25,00,000) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල විසින් එකී අංක 6376 සහ, 6378 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, මහගල්බඩ මෙගොඩ කෝරලේ, තෝරයාය ගමේ පිහිටි, ගාල්ලේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ඩී. ප්‍රේමරත්න මහතා විසින් 2003.12.04 දින මැන සාදන ලද අංක 25/2004 පිඹුරේ කැබලි අංක X දරන ඉඩමට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : ඇල ද, යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් තුනයි දශම අටක් (අක්. 01, රූ. 02, පර්. 3.8) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේ ද සමග වේ.

A/1362/228 - කුරුණෑගල

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(වයඹ කලාපය),
වෙනුවට,
වැඩ බලන ප්‍රාදේශීය කළමනාකාර.

මහජන බැංකුව,
කලාප කාර්යාලය,
අංක. 210, වැහැර,
කුරුණෑගල.

09-416

---

### සම්පත් බැංකුව - පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0040 1000 2716.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ ජුනි මස 25 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන එස්. කේ. දසනායක යන අය විසින් ලියා සහතික කරන ලද 2006 අගෝස්තු මස 31 දාතම හා අංක : 1867 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කඩවත මහර, නුවර පාර, අංක 144/1, හි ලියාපදිංචි කාර්යාලය සහිතව එකී ජනරජයේ සමාගම් නීතිය යටතේ නිසිලෙස සංස්ථාගතකොට ඇති සමාගමක් වන හවුස් ඔෆ් ඇපරල්ස් (ප්‍රයිවට් ලිමිටඩ්) බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැටහතර ලක්ෂ හැත්තෑ එක්දහස් විසිතුනයි ශත අසූවක (රු.64,71,023.80) මුදලක් 2009 මැයි මස 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැටහතර ලක්ෂ හැත්තෑ එක්දහස් විසිතුනයි ශත අසූවක (රු.64,71,023.80) මුදලද 2009 මැයි මස 12 දින සිට අංක : 1867 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැටඑක් ලක්ෂ හැත්තෑ එක්දහස් අටසිය අනූහතයි ශත හැටඑකක (රු.61,71,897.61) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයක් (9%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබීඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1867 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, උතුරු මාකොළ ග්‍රාමයේ පිහිටි ගුණරත්න මාවත, වරිපනම් අංක. 308/7, දරන "කොස්ගහලන්ද" යයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන වී. එෆ්. ජේ. පෙරේරා විසින් සාදන ලද 1972 නොවැම්බර් මස 27 දාතම හා අංක 5176 පිඹුරේ දැනට පවතින පරිදි ලොට් 9 සහ 10 වශයෙන් නිර්ණය කොට ඇති ඒකාබද්ධයක් වන) බලයලත් මානක තැන එච්. එම්. එස්. පෙරේරා විසින් සාදන ලද 2006 මැයි මස 06 දාතම හා අංක 2464 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් එක්ස් වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : ඊසානට : ලොට් 1, 12 (අඩි 10 පළල පාර සඳහා වෙන් කිරීම) සහ එකී පිඹුරු අංක 5176 හි ලොට් 11 ගිණිකොනට : එකී පිඹුරු අංක 5176 හි ලොට් 11 සහ 12 (අඩි 10 පළල පාර සඳහා වෙන් කිරීම) නිරිතට : පිඹුරු අංක 2466 හි ලොට් වයි සහ පිඹුරු අංක 243 හි ලොට් 3 සහ වයඹට : පිඹුරු අංක 243 හි ලොට් 5 සහ 6 (අඩි 5 පළල පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස්හයයි දශම දෙකයි බිංදුවක් (A0, R0, P36.20) (හෙක්ටයාර 0.09158) විශාල ඉඩම් කොටස සමග සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග පිඹුරු අංක 2464 ට අනුව වෙළුම/පත්‍රිුරුව සී 780/173.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ, උතුරු මාකොළ ග්‍රාමයේ ගුණරත්න මාවත, වරිපනම් අංක 308/10, දරන "මිල්ලගහවත්ත කොටස" යයි කියනු ලබන ඉඩමට (දැන් පවත්නා පරිදි සමගියෙන් බෙදාවෙන්කොට නිර්ණය කොට ඇති ඉඩම් කොටසේ උපබෙදුමක් වන) බලයලත් මානක තැන එච්. එම්. එස්. පෙරේරා විසින් සාදන ලද 2006 මැයි 06 දාතම හා අංක. 2466 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් වයි වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : එකී පිඹුරු අංක 5176 හි ලොට් 9 සහ 12 ගිණිකොනට : එකී පිඹුරු අංක 5176 හි ලොට් 12 සහ පාර (අඩි 15 සිට 12 පළල) නිරිතට : පාර (අඩි 15 සිට 12 පළල) සහ ලොට් එක්ස් සහ වයඹට : කේ. ටී. ලයනල් විසින් හිමිකම් කියන එම ඉඩමේ කොටසක් සහ පිඹුරු අංක 243 හි ලොට් 5 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහයි දශම හතයි පහක් (A0, R0, P30.75) (හෙක්ටයාර 0.07779) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්,

ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග පිඹුරු අංක 2466 ට අනුව වෙළුම/පත්ඉරුව සී 780/172 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන වී. එෆ්. ජේ. පෙරේරා යන අය විසින් සාදන ලද 1972 නොවැම්බර් 27 දාතම හා අංක 5176 පිඹුරේ ලොට් 12 මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්

09-432/8

---

## සම්පත් බැංකුව — පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංකය : 0069 1000 1262.

සීමාසහිත සම්පත් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008 ක් වූ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර යන අය විසින් ලියා සහතික කරන ලද 2006 පෙබරවාරි මස 10 දාතම හා අංක 1323 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තරකොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "ඩී. එන්. ජේ. ඉන්ඩස්ට්‍රීස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හෝමාගම, ගොඩගම, බොරුල්ල පාර, අංක 186/බී, හි හවුල් ව්‍යාපාරයක් කරගෙන යනු ලබන එකී ජනරජයේ හෝමාගම, ගොඩගම, බොරුල්ල පාර, අංක 186 හි පදිංචි ජයමහ හිටිහාමිලාගේ නිශාන්ත ජයමහ දිනූෂා ප්‍රසාදිනී අඹගහවූව සහ තිලකරත්න අඹගහවූව යන සියලු දෙනා බන්ධනදායීන් වශයෙන් හා එකී ජනරජයේ හෝමාගම, ගොඩගම, බොරුල්ල පාර, අංක 186 හි පදිංචි ජයමහ හිමිහාමිලාගේ නිශාන්ත ජයමහ උකස්කරු වශයෙන්ද පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දාසය ලක්ෂ දහ නම දහස් තුන්සිය පනස් තුනයි ශත තිස් හතරක (රු.16,19,353.34) මුදලක් 2008 සැප්තැම්බර් 23 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දාසය ලක්ෂ දහ නම දහස් තුන්සිය පනස් තුනයි ශත තිස් හතරක (රු.16,19,353.34) මුදල ද, 2008 සැප්තැම්බර් 24 දින සිට අංක 1323 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පහළොස් ලක්ෂ තිස් එක් දහස් හත්සිය අසූ හයයි ශත දහ අටක (රු.15,31,786.18) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1323 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු උඩුකහ කෝරළේ දඹදෙණි හත්පත්තුවේ අලව්ව ප්‍රාදේශීය සභා සීමාව තුළ පරමවුල ග්‍රාමයේ පිහිටි "යහලදෙණියේ වත්ත මැදපොළේ වත්ත සහ ගල්ගොඩේ හේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. රත්නායක යන අය විසින් සාදන ලද 2005 නොවැම්බර් මස 24 දින දාතම හා අංක 162-2005 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ගුණවර්ධන විසින් හිමිකම් කියන ඉඩම සහ පියසේන විසින් හිමිකම් කියන ඉඩම, නැගෙනහිරට : ගිරිඋල්ල පාර සිට මීරිහෙලිය දක්වා ප්‍රාදේශීය සභා පාර දකුණට : ලීලාවතීගේ ඉඩම සහ යත්තල්ගොඩගේ ඉඩම (නන්දාවතී සහ යත්තල්ගොඩ ගේ ඉඩම වශයෙන් ඔප්පුවේ සඳහන් නමුත්) සහ බස්නාහිරට : පතිරණ සහ ගුණවර්ධන ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් විසි තුනයි දශම පහක් (A0, R3, P23.5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, එකී පිඹුරු අංක. 162-2005 අනුව වෙළුම/පත්ඉරුව එෆ් 1172/244 හි කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-432/10

---

## මහජන බැංකුව - මිනුවන්ගොඩ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ. ද සිල්වා විසින් සහතික කරන ලද 2006.12.22 දිනැති අංක 4001 දරන උකස්කරය සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඊවා ඩොරින් මල්ලවආරච්චි විසින් සහතික කරන ලද 2007.11.05 දිනැති අංක 327 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සෝදිගේ සමන්ත මනෝජ් පෙරේරා, සෝදිගේ තුෂාර ප්‍රසාද් පෙරේරා සහ සෝදිගේ ඉන්දික ප්‍රදීප් පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් හැට නවදහස් හයසිය හැත්තෑ හතයි ශත හතලිස් හතර (රු. 69,677.44) ක මුදලක් සහ රුපියල් දෙලක්ෂ විසිදහස් අටසිය තිස්තුනයි ශත හතළිහ (රු. 2,20,833.40) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.09.10 දින සිට වර්ෂයකට 21% බැගින් හැට නවදහස් හයසිය හැත්තෑ හතයි ශත හතලිස්

හතර (රු. 69,677.44)ක මුදලක් සහ 2008.09.10 දින සිට වර්ෂයකට 22.5% බැගින් රුපියල් දෙලක්ෂ විසිදහස් අටසිය තිස්තුනයි ශත හතලිහ (රු. 2,20,833.40)ක මුදලක්, සඳහා වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හැට නවදහස් හයසිය හැත්තෑ හතයි ශත හතලිස් හතර (රු. 69,677.44) ක මුදල සහ රුපියල් දෙලක්ෂ විසිදහස් අටසිය තිස්තුනයි ශත හතලිහ (රු. 2,20,833.40) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 4001 සහ 327 දරන උකස්කරයන් යටතේ එකී ලංකා බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

මෙම සුරැකුම මත අංක 4000-2006.12.22 දරන උකස්කරය යටතේ ප්‍රදානිත රු. 5,25,000 සහ අංක 328-2007.11.05 දරන උකස්කරය යටතේ ප්‍රදානිත රු. 4,00,000ක ස්ථිර අයිරාවන් ක්‍රමික ගණයේ පවතී.

### දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල සීමාවට අයත් පන්සිල්ගොඩ පිහිටි මාරගහවත්තේ කැබැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. නන්දන සෙනෙවිරත්න විසින් 1993.09.14 වැනි දින මැන සකස් කළ අංක 1885 දරන පිඹුරට අනුව එකී ඉඩමේ කොටස සඳහා මායිම්, උතුරු-නැගෙනහිරට : පාර, දකුණු-නැගෙනහිරට : කැමිල් ෆොන්සේකාට අයිති ඉඩම සහ යූ. එල්. ලැම්බට් පෙරේරාට අයිති ඉඩම, දකුණු-බස්නාහිරට : ජෝර්ජ් බෙනඩික්ට් පෙරේරාට අයිති ඉඩම ද, උතුරු-බස්නාහිරට : කේ. මාග්‍රට් පෙරේරා සහ කේ. වාලට් පෙරේරාට අයිති ඉඩම සහ එස්. දයාපාල පෙරේරාගේ උරුමක්කරුවන්ට අයිති ඉඩම යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් අටයි දශම දෙකයි තුන (අ. 0, රූ. 1, පර්. 8.23) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළුදේත් සමගින් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 928/108 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

09-414

---

## මහජන බැංකුව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් ජනත් ජයවර්ධන විසින් සහතික කරන ලද 2007.11.23 දිනැති අංක 3065 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රූබසිංහ සිරිවර්ධන ගුණසේන, සිරිමතී නානායක්කාර යන අයවළුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂයක (රු. 4,00,000) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.06.20 දින සිට වර්ෂයකට 21% බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂයක (රු. 4,00,000) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඒ. එස්. ලියනගේ මහතා විසින් එකී අංක 3065 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තරය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොටගම් පත්තුවේ, කොලොන්න ප්‍රාදේශීය සභා සීමාව තුළ දාපනේ ගමෙහි පිහිටි වැලිලියද්දේ රාලගේ හේන දලක්ගහයාය සහ වැලිලියද්දේ රාලගේ ඕවිට නමැති ඉඩමට අවසරලත් මානක කේ. ජී. ධර්මදාස මහතා විසින් 2004.02.09 වැනි දින මැන බෙදා වෙන් කරන ලද අංක 1654 දරන පිඹුරේ ලොට් 3 දරන ඉඩම් කොටසට එකී පිඹුරුපතට අනුව මායිම් වශයෙන්, උතුරට : 1478 දරන පිඹුරේ ලොට් 2 ද, නැගෙනහිරට : 1101 දරන පිඹුරේ ලොට් 10 ද, දකුණට : 1478 දරන පිඹුරේ ලොට් 4 ද , බස්නාහිරට : 1101 දරන පිඹුරේ ලොට් 10 සහ 4 ද යන මායිම් තුළ පිහිටි අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් දහඅටයි දශම හතරයි පහක් (අ. 1, රූ. 2, පර්. 18.45) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියළුම දේද වේ.

මෙම ඉඩම දැනට රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 93/226 දරන පත්තිරු යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
සබරගමුව.

මහජන බැංකුව,
සබරගමුව කලාප කාර්යාලය,
නව නගරය, රත්නපුර.

09-417

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2500002106.

ණයකරුගේ සම්පූර්ණ නම : මානාගොඩේ ගෙදර තුසිත උපාලි මංගලගම සහ සතුරුසිංහගේ රසංගිකා චතුරානි සතුරුසිංහ.

කෑගල්ල ප්‍රසිද්ධ නොතාරිස් රොමෙල් විජේවර්ධන විසින් ලියා සහතික කරන ලද 11814 හා 2008.12.18 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපල මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාර ලක්ෂ අසූ හතර දහස් හයසිය හතළිස් පහයි ශත විසි හතක (රු. 4,84,645.27) මුදලක් වර්ෂ 2008.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතු ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාර ලක්ෂ හාර දහස් පන්සිය විසිතුනයි ශත විසිහයක (රු. 4,04,523.26) මුදලද, වර්ෂ 2008.12.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් අසූ දහස් එකසිය විසි දෙකයි ශත එකක් (රු. 80,122.01) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාර ලක්ෂ අසූ හතර දහස් හයසිය හතළිස් පහයි ශත විසි හතක (රු. 4,84,645.27),

(2) එකී රුපියල් හාර ලක්ෂ හාර දහස් පන්සිය විසිතුනයි ශත විසි හයක (රු. 4,04,523.26) මුදල මත අයවිය යුතු වර්ෂයකට 24% බැගින් වන පොළියක් 2009.01.01 දින සිට දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකල හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපල හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ ජනවාරි මස 27 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දහය කෝරළේ, වැඋඩවිල්ලි හත් පත්තුවේ, තෝරවතුර ග්‍රාමයෙහි පිහිටි කරපතවිනයාගර්වත්ත නමැති ඉඩමට 2007.04.30 සහ 2007.08.11 දින එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මානක තැන විසින් මැන සම්පාදිත අංක 4556 පිඹුර ප්‍රකාර කැබලි අංක 21ට මායිම්, උතුරට : කැබලි අංක 19 ද, නැගෙනහිරට : ගල ද, දකුණට : එම ඉඩමේම ඉතුරු කොටස සහ පන්සලට අයත් ඉඩම ද, බටහිරට : එම ඉඩමේ ඉතුරු කොටස සහ කැබලි අංක 12 දරන පාර යන මායිම් තුළ පිහිටි පර්චස් විසිපහක (අක්කර 0, රූඩ් 0, පර්චස් 25) වපසරියකින් යුතු මෙම ඉඩම ගොඩනැගිලි හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවයද සමග වේ. කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1666/109 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

09-455

---

### මහජන බැංකුව - කුරුණෑගල ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.05.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ප්‍රසිද්ධ නොතාරිස් වයි. පී. කේ. තෙන්නකෝන් මහත්මිය විසින් සහතික කරන ලද 2005.08.12 දිනැති අංක 4435 සහ 2005.08.12 දිනැති අංක 4434 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් අහමඩ් ලෙබ්බේ නෙයිනා මොහොමඩ්, අහමඩ් ජමාල්දීන් මොහොමඩ් හිල්මුන් නිස්තාර් සහ අබ්දුල් සලාම් මොහොමඩ් බිෂ්රි යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද එකී උකස්කරයන් යටතේ, පිළිවෙලින් රුපියල් දහසය ලක්ෂ හැට හතර දහස් එකසිය හැත්තෑ හතරයි ශත හතළිස් හයක් (රු. 16,64,174.46) මුදලක් සහ රුපියල් පහලොස් ලක්ෂයක් (රු.15,00,000) දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.11.27 දින සිට වර්ෂයකට සියයට දහනවයයි දශම පහ (19.5%) බැගින් රුපියල් දහසය ලක්ෂ හැට හතර දහස් එකසිය හැත්තෑ හතරයි ශත හතළිස් හයක් (රු. 16,64,174.46) මුදලක් සහ වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් රුපියල් පහලොස් ලක්ෂයක (රු.15,00,000) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් දහසය ලක්ෂ හැට හතර දහස් එකසිය හැත්තෑ හතරයි ශත හතළිස් හයක (රු. 16,64,174.46) මුදලක් සහ රුපියල් පහලොස් ලක්ෂයක (රු.15,00,000) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල මහතා විසින් එකී අංක 4435 සහ 4434 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 29ඩී (29D) වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපල පිළිබඳ විස්තර

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන් දහය කෝරළේ, වැඋඩවිල්ලි හත් පත්තුවේ කුරුණෑගල මහ නගර සභා සීමාව තුළ වෙලගෙදර වීදියෙහි වරිපනම් අංක 67 දරන ස්ථානයේ පිහිටි, "ගෙවත්ත" නම් ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර මහතා විසින් 1999.06.08 දින මැන සාදන ලද අංක 6094 දරන පිඹුරේ, සඳහන් බිම් කොටස සහ එහි පිහිටි ගසකොළ පලතුරු ආදී සෑම සියලු දේ. ඉඩමට මායිම් උතුරට : මහ නගර සභාවට අයත් ඉඩම, නැගෙනහිරට : බසාර් වීදියේ වරිපනම් අංක 69 දරන ලංකා හාඩ්වෙයාර් ගොඩනැගිල්ල, දකුණට : බසාර් වීදියේ වෙල ගෙදර වීදිය, බස්නාහිරට : බසාර් වීදියේ වරිපනම් අංක 65 දරන කැන්ඩි ස්ටෝර්ස් ගොඩනැගිල්ල,

යන (අක්කර 0, රූඩ් 0, පර්චස් 09) විශාල ඉඩම හා ඒ තුළ පිහිටි ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ. මෙය කුරුණෑගල ඉඩම් ලි. ප. කාර්යාලයේ ඒ 1372/258 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 210, කොළඹ පාර,
වැහැර, කුරුණෑගල.

09-419

---

### ලංකා බැංකුව - අම්බලන්තොට ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.07.23 වෙනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් එච්. ඒ. අමරසේන මහතා විසින් සහතික කරන ලද 2008.09.23 දිනැති අංක 10180 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.06.17 දින තෙක් පොලිය වශයෙන් රුපියල් තුන්ලක්ෂ පනස් දහස් හාරසිය තිස් එකයි ශත හැටහයක (රු. 3,50,431.66) මුදලක් සමඟ රුපියල් තුන්ලක්ෂයක (රු. 3,00,000) මුදලක් මත වසරකට සියයට විසිඅට (28%) බැගින් පොලියක්ද, 2009.06.18 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මාමඬල, වලවේවත්ත, ගඟ පාර හි පදිංචි කතළු හේවගේ බොනී මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 10180 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් තුන්ලක්ෂ පනස්දහස් හාරසිය තිස් එකයි ශත හැටහයක (රු. 3,50,431.66) මුදල සමඟ 2009.06.18 වෙනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මාතර කොටුව, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, අම්බලන්තොට ශාඛාවේ, ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවාපත්තුවේ, වලවේවත්ත නැගෙනහිර, ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ මාමඬල හි පිහිටි කුවුන් ලෑන්ඩ් ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. කේ. ගුණසේකර විසින් සාදන ලද 2002 මැයි මස 27 දිනැති අංක 3379 දරන පිඹුරේ ලොට් අංක 01 වශයෙන් දක්වා නිරූපනය කර ඇති බිම් කැබැල්ල උතුරට : බස්නාව වෙන්කළ කොටස ද, නැගෙනහිරට : එම ඉඩමේම ලොට් 2 ද, දකුණට : ගඟ පාර සහ බස්නාහිරට : බේබි නෝනා හිමිකම් කියන ඉඩම ද, මායිම්ව එකී අංක 3379 දරන පිඹුර ප්‍රකාර රූඩ් දෙකයි පර්චස් විස්සක (අක්කර 0, රූඩ් 2, පර්චස් 20) වපසරියකින් යුක්තවන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියළු දේ සමග පාරට වෙන්කළ සියළු කොටස් මතින් සහ ඒවා දිගේ පාරේ අයිතිය ද ඇත. මෙය හම්බන්තොට ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. හම්/135/365/99බී ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

එම්. ඒ. ගමගේ,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
අම්බලන්තොට.

09-448

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වුණ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1063 5304 1052.

2009 ජුනි මස 04 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනාකොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 05 තිඹිරිගස්යාය පාරේ අංක 69/2බී හි කොම්පන්නගේ අනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු යන අය බන්ධනදායී වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ජී. කේ. විජේතුංග විසින් සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමට ලියා සහතික කල 2005 ඔක්තෝබර් 18 දාතම හා අංක 2488 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරනලද ණය පහසුකම් ආපසු ගෙවීම/පියවීම පැහැර හැර ඇති හෙයින් 2009 මාර්තු මස 03 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියලත් දාහතර ලක්‍ෂ හැට හත් දහස් අනූහතරකුත් ශත දොලහක් (රු.14,67,094.12ක් පමණයි) එකී අංක 2448 දරන බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ මුදල වශයෙන් සම්පත් බැංකුව පීඑල්සී වෙත අයවිය යුතුව හිඟව ඇති හෙයින් එකී රුපියල් දාහතර ලක්ෂ හැටහත් දහස් අනූහතරකුත් ශත දොලහක් (රු. 14,67,094.12ක් පමණයි) සම්පූර්ණ හිඟ මුදල සමග තවත් රුපියල් දහතුන 'ලක්ෂ අනූ දහස් හතලිස් හයකුත් ශත තිස් පහක (රු. 13,90,046.35ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් 2009 මාර්තු 04 වන දින සිට එකී අංක 2448 දරන බැඳුම්කරය මත අයවිය යුතුව හිඟව ඇති සම්පූර්ණ ණය මුදල ගෙවා/පියවා නිමකරන දින තෙක් තවදුරටත් පොලී මුදලද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2448 දරන බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ

හා පරිශ්‍රය, මහනුවර බලයලත් නොතාරිස් අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා (බත්තරමුල්ල උපකාර්යාලය) සීමාව තුළ දකුණු තලංගම පිහිටි නාගහමුල්ල පාරේ කලින් වරිපනම් අංක 41/18 (කොටසක්) වූ දැනට වරිපනම් අංක 1013/සී 1 දරන "වරහන්තුඩුවේවත්ත" නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පතිරගේ විසින් මැන සාදන ලද 1995 ජනවාරි මස 15 දාතම හා අංක 1571 දරන පිඹුරේ (බලයලත් මිනින්දෝරු එස්. පී. ඉලංකෝන් විසින් මැන සාදන ලද 1978 අගෝස්තු 23 දාතම හා අංක 179 දරන පිඹුරේ නිරූපිත ලොට් බී හි උප බෙදුමක් වන) ලොට් බී1 ලෙස ලකුණු කොට නිරූපිත හෝමාගම ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 1605/24 හි ලියාපදිංචි කර ඇති එකී අංක 1571 පිඹුරට අනුව උතුරට : නාගහමුල්ල පාර ද, නැගෙනහිරට : ලොට් බී හි ඉතිරි කොටස ද, දකුණට : එම ඉඩමේම ලොට් ඒ ද සහ බටහිරට : එම ඉඩමේම ලොට් ඒ ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් පහක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 5) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද, සහන හා දාසත්වද සමගය.

හෝමාගම ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී 1605/24 හි ලියාපදිංචි කර ඇති බලයලත් මිනින්දෝරු පී. කේ. එම්. ද සිල්වා විසින් සාදන ලද 1973 සැප්තැම්බර් 16 දාතම හා අංක 91 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 දරන බිම් කොටස මතින් හා ඔස්සේ මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-432/4

---

### සම්පත් බැංකුව පී.එල්.සී.
(කලින් සීමාසහිත සම්පත් බැංකුව නමින් හැඳින්වුණ)

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය :

ගිණුම් අංක : 1016 5016 0291.

2009 ජූනි මස 04 වන දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී මෙසේ විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පේරාදෙණිය, ඒදඬුවාව, අරතැන්නෙහේන අංක 268 හි ගන්නොරුවේ කන්දෙගෙදර ප්‍රියන්ත කරුණාරත්න සහ රහලවෙලයායේ නොහොත් රහලවෙල යාලගේ සෝමවතී යන දෙදෙන බන්ධනදායින් වශයෙන් සහ එකී ජනරජයේ පේරාදෙණිය, ඒදඬුවාව, අරතැන්නෙහේන අංක 268 හි එකී රහලවෙලයායේ නොහොත් රහලවෙලයාලගේ සෝමාවතී යන අය උකස්කරු වශයෙන් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ජී. රණවීර විසින් සමාගම් අංක පී. කියු. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමට ලියා සහතික කල 2003 දෙසැම්බර් 18 දාතම හා අංක 4398 සහ 2005 මාර්තු මස 20 දාතම හා 4433 දරන උකස් බැඳුම්කරය මගින් බැංකුවට උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය ඇපයට ගෙන ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීම/පියවීම පැහැර හැරීමේ හේතුවෙන් 2009 පෙබරවාරි මස 10 වන දිනට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය ලක්ෂ විසිහතර දහස් එකසිය විසිහතකුත් ශත පනස් එකක් (රු. 6,24,127.51ක් පමණයි) එකී රුපියල් හය ලක්ෂ විසිහතර දහස් එකසිය විසිහතකුත් ශත පනස් එකක් (රු. 6,24,127.51ක් පමණයි) සම්පූර්ණ මුදල සමග තවත් රුපියල් හාර ලක්ෂ පහළොස් දහස් අසූ හතරකුත් ශත දෙකක් (රු. 4,15,084.02 ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට නවයයි දශම බැගින් තවත් රුපියල් එක් ලක්ෂ හැටඅට දහස් හත්සිය අනූ හතරකුත් ශත හැට නවයක (රු.1,68,794.69ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දොලහයි දශම පහ (12.5%) බැගින් 2009 පෙබරවාරි 11 වැනි දින සිට එකී අංක 4398 සහ 4433 දරන බැඳුම්කරය මත අයවිය යුතුව හිගව ඇති සම්පූර්ණ ණය මුදල ගෙවා/පියවා නිමා කරන දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් සහ වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේ නම්) අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 4398 සහ 4433 දරන බැඳුම්කරය මගින් එකී ණය පහසුකම් සඳහා ඇප වශයෙන් සම්පත් බැංකුවට පීඑල්සී වෙත උකස් තබන ලද මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනැවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය, කොළඹ බලයලත් නොතාරිස් පී. කේ. ඊ. සේනාපති විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට සීමාසහිත සම්පත් බැංකු පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙසේ යෝජනා කොට සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ පළාත පත්තුවේ, යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ ඒදඬුවාවේ පිහිටි අරත්තන හේන දැන් වත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. බී. කිරිදෙන විසින් මැන සාදන ලද 2003 නොවැම්බර් 23 දාතම හා අංක 3064 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස ලකුණු කොට දක්වා ඇති මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව බී 358/280 හි ලියාපදිංචි කර ඇති එකී අංක 3064 පිඹුරට අනුව උතුරට : එම ඉඩමේම ඉතිරි කොටසද, නැගෙනහිරට : නිවාස වල සිට කොළඹ-මහනුවර මාර්ගයට යන පාර ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ද සහ බටහිරට : පාර ද, මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් දෙකක් (අක්කර 0, රූඩ් 2, පර්චස් 0) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොල, වගාවන්, ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේ සහ එයට අදාළ සියලුම අයිතීන්, මාර්ග, වරප්‍රසාද සහන හා දාසත්ව ද සමගය.

අධ්‍යක්‍ෂ මන්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

09-432/6

---

### ලංකා බැංකුව - සමන්තුරෙයි ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වෙනි වගන්තිය යටතේ දැන්වීම

2009.06.12 වෙනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් එම්. යූ. තාහා සෙයිනුදීන් විසින් සහතික කරන ලද 1996.09.17 දිනැති අංක 8413 දරන බැඳුම්කරය මත මුල් මුදල හා අයිරා ගිණුම මත 2009.01.11 දින තෙක් පොළිය වශයෙන් රුපියල් හයලක්ෂ එකොලොස්දහස් එකසිය තිස් අටයි ශත හැත්තෑ තුනක (රු.6,11,138.73ක) මුදලක් සමඟ ස්ථිර අයිරා සීමාව වන රුපියල් පන්ලක්ෂයක් (රු. 5,00,000) මත වසරකට සියයට තිස්හතර (34%) බැගින් සහ ස්ථිර අයිරා සීමාව ඉක්මවා යන මුදල් සඳහා වසරකට සියයට තිස්හතර (34%) බැගින් පොළියක් ද, 2009.01.12 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සමන්තුරෙයි, සෙන්ට්‍රල් රෝඩ් හි "පූමා" හි පදිංචි සුලෙයිමාන් ලෙබ්බෙ මොහොමඩ් තව්ෆික් මහතා සහ අබ්දුල් රෂීඩ් ජමීලා උම්මා මහත්මිය යන දෙදෙනාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 8413 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හයලක්ෂ එකොලොස්දහස් එකසිය තිස් අටයි ශත හැත්තෑතුනක (රු. 6,11,138.73) මුදල සමඟ 2009.01.12 වෙනිදින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මඩකලපුව, මුදලියාර් පාර, අංක 8 හි පදිංචි වෙන්දේසිකාර ඒ. ඊ. කේ. තිස්ස වීරසිංහ මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වෙනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට සමන්තුරෙයි ලංකා බැංකු ශාඛාවේ, ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

උපලේඛනය :

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරෙයි පත්තුවේ සමන්තුරෙයි අංක 5 කොට්ඨාසයේ සෙන්ට්‍රල් පාරේ වරිපනම් අංක 3 සහ 5 දරන වේප්පඩි වලව් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. පත්මනාදන් විසින් සාදන ලද 1995.12.15 දිනැති අංක 570/95 දරන පිඹුරෙහි නිරූපිත ඉඩම් කැබැල්ල උතුරට : සෙන්ට්‍රල් රෝඩ් ද, දකුණට : ඒ. සවරියතුම්මාට (දැනට එම්. ටී. සහීඩ් සහ බිරිඳට) අයිති ඉඩම ද, නැගෙනහිරට : යූ. අහමඩ්ලෙබ්බෙට දැනට අබ්දුල් රහුමාන් සහ බිරිඳට අයිති ඉඩම ද, බස්නාහිරට : යූ, අහමඩ්ලෙබ්බෙට අයිති දැනට එම්. අයි. ඉස්මයිල් මහත්මිය උරුමකම් කියන ඉඩම ද, මායිම්ව පර්චස් දාසයයි දශම දෙකක (අක්කර 0, රූඩ් 0, පර්චස් 16.2) වපසරියකින් යුක්ත වන අතර, ඒ සියල්ල සමඟ නිවෙස, ළිඳ, සහ අංක 570/95 දරන පිඹුර ප්‍රකාර එහි සියල්ල ද වේ.

එකී ඉඩම පහත සඳහන් ඉඩම් තුනෙහි එකතුවකි. එනම් :-

1. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරෙහි පත්තුවේ, සමන්තුරෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වේප්පඩි වලව් නැමති ඉඩම් කැබැල්ලෙහි උතුරු කොටසින් බෙදූ බස්නාහිර කොටස උතුරට : පාර ද, නැගෙනහිරට : සහ දකුණට : එම්. ඒ. අච්චාඋම්මාට සහ ස්වාමිපුරුෂයාට අයිති ඉඩම ද, බස්නාහිරට : අයි. අහමදු ලෙබ්බෙගේ ඉඩම ද මායිම්ව උතුරේ සිට දකුණට නැගෙනහිරෙන් බඹ 4 රියන් 1 1/2ක්ද, බස්නාහිරට බඹ 4 රියන් 1ක් ද, නැගෙනහිරට සිට බස්නාහිරට බඹ 12 1/2ක් ද, වපසරියකින් යුක්තවන අතර, ඒ සමඟ ඇති ගහකොළ ද වේ. මෙය කල්මුනේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී කොටසෙහි 58 වෙළුමෙහි 264 වන පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

2. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරෙයි පත්තුවේ, සමන්තුරෙයි කොට්ඨාසයෙහි පිහිටි "වේප්පඩි වලව්" නමැති ඉඩම් කැබැල්ලෙහි බෙදූ දකුණු කොටස, උතුරට : ආදම්ලෙබ්බෙ පෝඩි අහමඩ් ලෙබ්බෙ (ලාහියා) ගේ ඉඩම ද, නැගෙනහිරට : යූ. අහමඩ් ලෙබ්බෙගේ ඉඩම ද, දකුණට : ඒ සවරියාතුම්මාගේ සහ ස්වාමිපුරුෂයාගේ ඉඩම ද, බස්නාහිරට : අයි. අහමඩ් ලෙබ්බෙගේ ඉඩම ද, මායිම්ව උතුරේ සිට දකුණට බඹ පහයි (5) රියන් තුනක් (3) ද, නැගෙනහිර සිට බස්නාහිරට බඹ දාහතරකින් ද, (14) ද යුතු වපසරියකින් සමන්විත වන අතර , එහි ඇති ගහකොළ සහ අනෙකුත් සියළු දේ ද වේ. මෙය කල්මුනේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් කොටසෙහි 23 වන වෙළුමෙහි 195 වන පත්‍රිරුවෙහි ලියාපදිංචි කර ඇත.

3. නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරෙයි 1 කොට්ඨාසයේ පිහිටි වේප්පඩි වලව් නැමැති ඉඩම් කැබැල්ලෙහි උතුරු කොටසින් බෙදූ නැගෙනහිර කොටස උතුරට : පාර ද, නැගෙනහිරට : යූ. අහමඩ් ලෙබ්බෙගේ ඉඩම ද, දකුණට : 195 වන පත් ඉරුවෙහි ලියාපදිංචි ඉඩම ද, බස්නාහිරට : ලාහියාට අයිති ඉඩම ද මායිම්ව උතුරේ සිට දකුණට බඹ 5 රියන් 3 ක් ද, නැගෙනහිරට සිට බටහිරට බඹ එකයි (1) රියන් 2 වපසරියකින් යුක්ත වන අතර, එහි ගහකොළ සහ සියළු දේද වේ. මෙය කල්මුණේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් අංශයෙහි 23 වන වෙළුමෙහි 196 වන පත් ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. එම්. සුබෙයිර්,
කළමනාකරු.

ලංකා බැංකුව,
සමන්තුරෙයි ශාඛාව.

09-450

---

## මහජන බැංකුව - කුරුණෑගල ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත වර්ෂ 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් වයි. පී. කේ. තෙන්නකෝන් විසින් සහතික කරන ලද 2006.10.12 දිනැති අංක 5301 හා 2006.10.12 දිනැති අංක 5302 දරන උකස්කරය ප්‍රකාර අලංකාරගේ සුසන්ත සිල්වා යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්ද එකී උකස්කරය යටතේ පිළිවෙලින් රුපියල් තුන්ලක්ෂ අසූ දෙදහස් හයසිය පනහයි ශත පනස් හයක් (රු.3,82,650.56) සහ රුපියල් ලක්ෂ පහක් (රු.5,00,000) දැනට මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද පිළිවෙලින් 2007.11.16 දින සිට වර්ෂකයට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් රුපියල් තුන්ලක්ෂ අසූ දෙදහස් හයසිය පනහයි ශත පනස් හයක් (රු.3,82,650.56) සහ වර්ෂයකට සියයට විසි එකයි දශම පහ බැගින් (21.5%) ලක්ෂ පහක මුදලක් සඳහා ද වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය සහ අදාළ මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර පිළිවෙලින් එකී රුපියල් තුන්ලක්ෂ අසූ දෙදහස් හයසිය පනහයි ශත පනස් හයක් (රු.3,82,650.56) සහ රුපියල් ලක්ෂ පහක් (රු.5,00,000) මුදල අයකර ගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 5301 සහ 5302 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය

යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ 29 ඩී (29) වගන්තිය යටතේ ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තර**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, කුඩාගල්බඩ කෝරළේ අස්වැද්දුම ගමේ පිහිටි, ඉහළවැව හේන සහ ඉහළ වැව හේන වත්ත, නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක මහතාගේ අංක 1252 සහ 1994.07.12 දිනැති පිඹුරේ සඳහන් ලොට් 1 ඒ දරන ඉඩම හා එහි පිහිටි ඉඩමට මායිම් උතුරට : අංක 117 දරන පිඹුරේ දැක්වෙන ඉඩම සහ වඩාත් නිවැරදි ලෙස අංක 1117 දරන පිඹුරේ දැක්වෙන ඉඩම, නැගෙනහිරට : දැනට කරුණාතිලකට අයත් ඉඩම, දකුණට : අංක 1252 දරන පිඹුරේ ලොට් 1 බී දරන ඉඩම බටහිරට : පාරද යන මෙකී මායිම් තුළ වූ පර්චස් හයක් (අක්. 0, රූ. 0, පර්. 20ක්) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගසකොළ පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියළු දේද සමග වේ. (ඒ. 995/299 - කුරුණෑගල)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
කලාප කාර්යාලය.

මහජන බැංකුව,
කලාප කාර්යාලය,
අංක 210, වැහැර,
කුරුණෑගල.

09-418

---

**සම්පත් බැංකුව - පී.එල්.සී.**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

ගිණුම් අංක : 0023 1000 1875.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008 ක් වූ අගෝස්තු මස 28 වෙනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කළ සම්පත් බැංකුව පීඑල්සී වශයෙන් දැන් හඳුන්වනු ලබන සීමාසහිත සම්පත් බැංකුව (සමාගම් අංක පීකිව් 144 යටතේ ලියාපදිංචි කොට ඇත.) නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර විසින් ලියා සහතික කරන ලද 2006 ඔක්තෝබර් 25 දාතම හා අංක 974 දරන උකස් බැඳුම්කරය උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ "තරංගා කන්ස්ට්‍රක්ෂන්" වන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ උඩුබද්දාව, පහලගම පවත්වාගෙන යන ව්‍යාපාරයේ හවුල්කරුවන් වශයෙන් එකී ජනරජයේ උඩුබද්දාව පහලගම පදිංචි රන්වලගේ උපාලි සුනන්ද සහ බුත්ගම මුදියන්සේලාගේ ජොඇන් මෝඩ් චන්ද්‍රා ලක්ෂ්මී වෛද්‍යරත්න යන දෙදෙනා බන්ධනදායීන් වශයෙන් ද එකී උඩුබද්දාව, පහලගම පදිංචි එකී රන්වලගේ උපාලි සුන්නද උකස්කරු වශයෙන්ද පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙලක්ෂ හතලිස්පන් දහස් දෙසීය හැත්තෑ හයයි ශත අසූ හතර (රු.2,45,276.84) ක මුදලක් 2008 මැයි 27 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් දෙසීය හැත්තෑ හයයි ශත අසූ හතර (රු.245,276.84) ක 2008 ජනවාරි 19 වැනිදා සිට එකී අංක 974 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දෙලක්ෂ අටදහස් හාර සීයයක (රු.2,08,400) මුදලකට වර්ෂිකව සියයට දහනවයක් (19%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 974 දරන බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණු කුරුණෑගල හත්පත්තු කටුගම්පල කෝරළයේ උඩුබද්දාව පහලගම පිහිටි "සෙන්ට් බාර් ස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ඒ. එම්. සී. බණ්ඩාර විසින් සාදන ලද 2001 පෙබරවාරි මස 04 දාතම හා අංක 2926 පිඹුරේ ලොට් 1 වශයෙන් නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : සිරිල් යන අය විසින් දැන් හිමිකම් කියන බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර යන අය විසින් සාදන ලද අංක 142/89 දරන පිඹුරේ ලොට් 30, නැගෙනහිරට : වර්තමානයේ පාරක් වන හා බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර යන අය විසින් සාදන ලද අංක 142/89 දරන පිඹුරේ ලොට් 30, දකුණට : එකී බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර යන අය විසින් සාදන ලද අංක 142/89 දරන පිඹුරේ ලොට් 28 සහ බටහිරට : බලයලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර යන අය විසින් සාදන ලද අංක 142/89 දරන පිඹුරේ ලොට් 25 සහ 27 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්.18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් අංක 2928 දරන පිඹුරට අනුවය.

අංක 142/89 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 සහ 30 වශයෙන් ලකුණු කොට ඇති මාර්ග වෙන්කිරීම දිගේ හා ඒ මතින් මාර්ග අයිතියද සමගය.

එකී ලොට් 01 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :-

එකී උඩුබද්දාව පහලගම පිහිටි "සෙන්ට් බාර් ස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලය ලත් මානක තැන ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර යන අය විසින් සාදන ලද 1989 සැප්තැම්බර් 05 දාතම හා අංක 142/89 පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලකුණු කොට ඇති ලොට් 29 ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී පිඹුරේ ලොට් 31

නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 30 දකුණට : එකී පිඹුරේ ලොට් 28 සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 25 සහ 27 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ. 0, රූ. 0, පර්.18) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් වෙළුම/පිටුව කේ 219/30 හි කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-432/13

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගිණුම් අංක : 1068 5330 6450.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008 ක් වූ මැයි මස 14 වෙනි දින පවත්වන්නට යෙදුණ රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පී. එල්. සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් අයි. අයි. ආර්. වීරගොඩ යන අය විසින් ලියා සහතික කරන ලද 2007 නොවැම්බර් මස 13 දාතම හා අංක 954 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, වේයන්ගොඩ, පරමුල්ල අංක 296/4හි පදිංචි වැපොල පතිරන්නැහෙලාගේ ගිහාන් චින්තක යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පන් ලක්ෂ පනස් අට දහස් පන්සිය හතයි ශත අනූ නමයක (රු. 5,58,507.99) ක මුදලක් 2009 ජනවාරි 28 වෙනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් පන් ලක්ෂ පනස් අට දහස් පන්සිය හතයි ශත අනූ නමයක (රු. 5,58,507.99) ක මුදල ද 2009 ජනවාරි 29 වෙනි දින සිට අංක 954 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් පන් ලක්ෂ දහදහස් එකසිය තිහයි ශත විසි අටක් (රු. 5,10,130.28) මුදලක් සඳහා වර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 954 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ, ගම්පහ (ගලහිටියාව ඒකකය) ප්‍රාදේශීය සභා සීමාව තුළ බුලුගහගොඩ ග්‍රාමයේ පිහිටි කඳාන පාර, වරිපනම් අංක 375/11 දරන "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. චන්ද්‍රතිලක විසින් සාදන ලද 1999 පෙබරවාරි මස 22 දාතම හා අංක 2057 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1ඒ වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඊ. ඩී. විලියම්ගේ ඉඩම, නැගෙනහිරට : ඩී. යූ. ආර්. අපෝන්සුගේ ඉඩම, දකුණට : ලොට් 1 බී (පාර) සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම අටයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 9.80 ) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 2057ට අනුව වෙළුම/පත්ඉරුව බී 659/65 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එස්. ඩී. චන්ද්‍රතිලක විසින් සාදන ලද 1999 ජනවාරි මස 02 දාතම හා අංක 2057 පිඹුරේ ලොට් 1බී.

බලයලත් මානක තැන එස්. බී, ජයසේකර යන අය විසින් සාදන ලද 1987 මාර්තු මස 20 දාතම හා අංක 2011 පිඹුරේ ලොට් 6.

මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-432/5

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගිණුම් අංක : 0069 1000 2048.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ මැයි මස 14 වෙනි දින පවත්වන්නට යෙදුණ රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

සමාගම් අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පී. එල්. සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2006 ඔක්තෝබර් මස 31 දාතම හා අංක 1499 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, "ලක් සහ ලාල් එන්ටප්‍රයිසස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කොස්ගම, පහල කොස්ගම, අංක 319 හි කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන හෝමාගම, පනාගොඩ,

හයිලෙවල් පාර, අංක 9/5 හි පදිංචි සමරක්කොඩි විජිත් ප්‍රේමලාල් යන අය බන්ධනදායීන් වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස් නම ලක්ෂ නමදහස් හත්සිය හැත්තෑ හතරයි ශත අනූහතක (රු. 3,909,774.97) ක මුදලක් 2009 ජනවාරි 27 වැනි දිනට එකී සම්පත් බැංකුව පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් තිස්නම ලක්ෂ නමදහස් හත්සිය හැත්තෑ හතරයි ශත අනූහතක (රු. 39,09,774.97) ක මුදලක් 2009 ජනවාරි 28 වැනි දින සිට එකී අංක 1499 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් තුන්ලක්ෂ තිස්අට දහස් හාරසීයයක (රු. 3,38,400) මුදලක් වර්ෂිකව සියයට හයයි දශම පහක් (6.5%) හා තවත් තුන් ලක්ෂ තිස් එක් දහස් පන්සීයයක (රු. 3,310,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 1499 දරන බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පී.එල්.සී. වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පනාගොඩ ග්‍රාමයේ "හික්ගහවත්ත නොහොත් අනන්ගලයාවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. රාමක්‍රිෂ්නන් විසින් සාදන ලද 1991 අප්‍රේල් මස 01 දාතම හා අංක 4186 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 7 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට ඃ මෙහි ලොට් 1, නැගෙනහිරට ඃ පිඹුරු අංක 1609 හි ලොට් සී (මීටර් 3 පළල පාර සඳහා වෙන් කිරීම) දකුණට ඃ පිඹුරු අංක 1609 හි ලොට් සී සහ බස්නාහිරට ඃ මෙහි ලොට් 1 සහ 6 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසිපහයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 25.7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන්ද සමග එකී පිඹුරු අංක 4186 ට අනුව වෙළුම/පත්ඉරුව ජී 1492/218හි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 4186 හි වෙනත් පොදු අයතීන් සහ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-432/2

---

පීවී 64780.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "හිස කේ සැලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.07.10 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "හිස කේ සැලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "හිස කේ සැලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ට්‍රරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 අගෝස්තු මස 24 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

09-468

---

### මහජන බැංකුව - ජා-ඇල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.06.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2006.07.25 දිනැති අංක 11437 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රතඹලා මුදියන්සේලාගේ ඇන් ශ්‍යාමිලා රත්නායක සහ දොන් ගිහාන් මනෝජ් රත්නසේකර යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින්ද එකී උකස්කරය යටතේ දැනට රුපියල් විසි ලක්ෂ තිස් අටදහස් හාරසිය අසූහයයි ශත අසූහය (රු. 20,38,486.86) ක මුදලන් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.11.28 වැනි දින සිට වර්ෂයකට 17.5% බැගින් රුපියල් විසි ලක්ෂ තිස් අටදහස් හාරසිය අසූහයයි ශත අසූහය (රු. 20,38,486.86)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසිලක්ෂ තිස් අටදහස් හාරසිය අසූහයයි ශත අසූහය (රු. 2,038,486.86) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 11437 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල සීමාවට අයත් යාගොඩමුල්ල ගමේ පිහිටි කහටගහලන්ද හෙවත් ගොන්නගහලන්ද හෙවත්

ගොරකගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් මහතා විසින් 2005.11.25 වැනි දින මැන සකස් කරන ලද පිඹුරු අංක 3861 දරන පිඹුරට අනුව ලොට් 3 දරන කොටස සඳහා මායිම්, උතුරට : ලොට් අංක 02 ද, නැගෙනහිරට : අඩි 20 පළල පාර ද, දකුණට : ලොට් 04 ද, බස්නාහිරට : එස්. ඩී. රංජිත් සමරවීරට අයත් ඉඩම යන මායිම් තුළ පිහිටි පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 879/227 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කළ කොටස්වල මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

09-415

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.07.09 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මාතර මහජන නොතාරිස් එල්. එස්. වීරක්කොඩි මහතා විසින් සහතික කරන ලද 2008.03.28 දිනැති අංක 367 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.06.17 දින තෙක් පොළිය වශයෙන් රුපියල් හැත්තෑ හතර ලක්ෂ හැටහතර දහස් අටසිය අනූතුනයි ශත එකොළහක (රු. 74,64,893.11) මුදලක් සමග රුපියල් හැටහතර ලක්ෂ හැත්තෑතුන්දහස් දෙසීය තිස්එකයි ශත දෙකක (රු. 64,73,231.02) මුදලක් මත වසරකට සියයට විසිහතරයි දශම හතයි පහ (24.75%) බැගින් පොළියක් ද, 2009.06.18 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ගාල්ල, වංචාවල, මීගොඩ, මූණමල්ගහවත්ත, අංක 242/ඒ හි පදිංචි නිශාන්ත චන්දන ධර්මසිරි අරුමප්පෙරුම මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 367 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් හැත්තෑහතර ලක්ෂ හැටහතර දහස් අටසිය අනූතුනයි ශත එකොළහක (රු. 74,64,893.11) මුදල සමග 2009.06.18 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මාතර, කොටුව, විල්ප්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි පදිංචි වෙන්දේසිකාර එම්. එච්. පද්මානන්ද සිරිවර්ධන මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, ගාල්ල අධිශ්‍රේණිය ශාඛාවේ, ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගාල්ල මහ නගර සභාවේ සහ සතර මායිම් තුළ, කුඹල්වැල්ලෙහි පිහිටි රිච්මන්ඩ් හිල් පාරේ, වරිපනම් අංක 251/8 දරන කුඹල්මුල්ලෙදෙණිය, කුඩලුමුල්ල, මිල්ලගහවත්ත නොහොත් ලියන වඩුගේවත්ත සහ කුඩාමුල්ලෙදෙණිය ලොට් 4, 5, 7 සහ 8 නැමති යාබද ඉඩම් කැබැලිවල ලොට් 3 ලෙස දක්වා ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3, උතුරට : එම්. සී. පාර (අඩි 10 පළල) සහ දුම්රිය පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : රිච්මන්ඩ් විද්‍යාල පරිශ්‍රය ද, බස්නාහිරට : ලියනවඩුගේ වත්ත ද මායිම්ව බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ජී. ද සිල්වා විසින් සාදන ලද 1991 නොවැම්බර් මස 4 සහ 6 දිනැති අංක 3914 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස් දෙකයි දශම එකයි නවයක (අ. 0. රූ. 0, පර්. 32.19) වපසරියකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ අනෙකුත් සියළු දේද වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 482/31 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ඩී. කේ. එන්. පියසෝම,
ප්‍රධාන කළමණාකරු.

ලංකා බැංකුව,
ගාල්ල අධිශ්‍රේණි ශාඛාව.

09-449

---

## කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකයः 310570.

2009 මාර්තු මස 24 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එල්. වීරසේකර විසින් 2006 ජූලි මස 21 වන දින සහතික කරන ලද අංක 10032 දරන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.) හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වෙත්තසිංහගේ නිමල් වෙත්තසිංහ සහ අන්තෝනිදූර නිශාන්ති ධම්මිකා සිල්වා ණයකරුවන්/උකස්කරුවන් හැටියටද, පැහැරහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දාහත් ලක්ෂ හත්සිය තිස්තුනයි ශත හතලිස් එකක (රු. 1,700,733.41) මුදලක් 2008 නොවැම්බර් මස 27 වන දින වනවිට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල්

දාහත් ලක්ෂ හත්සිය තිස්තුනයි ශත හතලිස් එකක (රු. 1,700,733.41) මුදලට 2008 නොවැම්බර් මස 28 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 1,422,989 ක මුදල මත 15.5% ක වැඩිදුර වාර්ෂික පොළියද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයක් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත් අඩුකොට එකී අංක 10032 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛණයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ප්ස්ඩෝප් වීදියේ, අංක 99 හි, බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### ඉහතකී උපලේඛණය

බලයලත් මානක එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් 1996 ජනවාරි මස 8 වන දින සාදන ලද අංක 12818 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ, පානදුර තල්පිටි දෙබැද්ද පින්වත්ත පිහිටි වෙලබොඩ පැලවත්ත හෙවත් බදුල්ලගහවත්ත කියන ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන්කරන ලද ලොට් 4 දරන කොටසට මායිම්, උතුරට : අංක 12818 දරන පිඹුරේ ලොට් 1 සහ (පාරක් සඳහා වෙන්කරන ලද) ලොට් 5 ද, නැගෙනහිරටඃ අංක 12818 දරන පිඹුරේ ලොට් 3 සහ (පාරක් සඳහා වෙන්කරන ලද) ලොට් 5 ද, දකුණටඃ වෙලබොඩ පැලවත්ත හෙවත් බදුල්ලගහවත්ත ඉඩමේ කොටසක් ද, බස්නාහිරටඃ යූ. ජස්ටින් සිල්වාට සහ ඒ සෝමවතී පෙරේරාට අයිති කුළුනෙදිනියද, යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම පානදුර ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 324/137 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචි වී ඇත.

එකී ලොට් 4 මෑතකදි සිදුකරන ලද මිණුම අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බලයලත් මානක ඒ. එම්. ආර්. ජයසේකර විසින් 2005 සැප්තැම්බර් මස 08 වැනි දින සාදන ලද අංක 4704 දරන පිඹුර පරිදි එකි පින්වත්ත පිහිටි වෙලබොඩපැලවත්ත හෙවත් බදුල්ලගහවත්ත කියන ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් "ඩී" දරන කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ (අඩි 12 පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් ඒ සහ බී ද, නමුත් ඉතා මෑතකදී (අඩි 12 පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් ඒ සහ ඊ ද, නැගෙනහිරට : එම ඉඩමේ (අඩි 12 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් ඊ ද, දකුණට : එම ඉඩමේ (අඩි 15 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් එෆ් ද සහ බස්නාහිරට : කුළුනෙදිනියද යන මායිම් තුළ පර්චස් විස්සක (අ.0 , රූ. 0, පර්. 20) විශාල ඉඩම.

ආර්. ආර්. දුනුවිල මහත්මිය,
සමාගම්/ලේකම්.

09-400

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.